# මහා මංගල සූත්‍රය



අකුරේගොඩ රතනසාර හිමි

# අවුකන සම්බුදු හිමියනි

**2010 සැප්තැම්බර් 22 වන බදාදා**
**බුදුසරණ**

කලා වැවේ නිල් දිය මත රැළි පිට රැළි
වලා ගැබින් මෙලොව වඩින හිරු කුමරුන්
සලා සෙමර ඇල් පවනින් පරිසරයම
කලා කෙතක සෙල් කුළු මත සම්බුදු ගුණ

පිබිදුණු සිය පතෙහි රේණු බුදු සිරිපද
පෙරවුණු බුදු සිවුරේ රැළි තාලයකට
හැඩවුණු බඳ පටියෙන් චීවරයේ සිරි
විහිදුණු බුදු සිරසින් සවණක් රැස් නුඹ

අඩවන් වූ දෙනෙත තුළින් කරුණා ගුණ
සොබමන් වූ දෙතොල සිනා යාන්තමට
සඳවන් වූ මුහුණ පුරා සිත සොමිගුණ
දිවමන් වූ බුදු හිමියන් මා අබියස

බුලත්සිංහල ධම්මානන්ද හිමි

## නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!!

භාග්‍යවත් පිංවත්නි.

ක්ෂණ මාත්‍ර කාලය කුඩු මෛත්‍රී භාවනා කලා හට සසර අනන්ත සැප සම්පත් ලැබෙන්නේය. භාවනාවට ප්‍රථම එය නියම අන්දමට කිරීම සඳහා තමාට විවේකයක් ලැබෙන අවස්ථාවක විවේක ස්ථානයක බුදුරජාණන් වහන්සේට මල්, පහන්, පූජාකර,පිරිසිදු සිතින් තමාගේ සමීපතම නෑදෑ හිත මිතුරන්ට ද, ඉන්පසු වෙනත් ඇසුරු කරන්නන්ටද, ඉන්පසු දුකට වේදනාවට පත්වූවන් කෙරෙහි ද, ඉන්පසු සතර අපාගතව දුක්පීඩා විඳිනවුන්ටද, මෙම ආකාරයට සියලුම සත්වයින්ට මෛත්‍රී සිත උපදවා ගන්න.නැවත නැවත මෙනෙහි කරන්න.

තමා දැන හෝ නොදැන පස් පව්, දස අකුසල් , නොකට යුතු වෙළෙඳාම් ආදිය කෙරෙනවාද කියා මෙනෙහි කර බලන්න.

ඉන් පසුව මස්,මාංශ,බිත්තර එයට සම්බන්ධ වෙනත් ආහාර වර්ග දැකීමෙන් ඇසීමෙන් සිතාගන්න.

තිරිසන් අපාගතව උපන්නාවූ සත්වයින් මාගේ මව වී,පියා වී,අඹු දරුවන් වී, දුකේදී පිහිටවූ මිතුරන් වී ඇත් ද මෙම සත්වයා මොනයම් ක්‍රමයකින් හෝ මට අනන්ත සසරේ දී එකතුවී ඇති මොනයම් හෝ අකුසල කර්ම විපාකයකින් සත්ව ලෝකයේ උපත ලබා අපමණ මරණ බියෙන් අපමණ මරණ වේදනාවෙන් අවසන් හුස්ම යවන්න ඇත් ද මාගේ ශරීරයට රසකර කන්නේ මෙම අහිංසක සතුන්ගේ මළකුණුද කියා සිතා විනාඩි 10ක් 15ක් වත් භාවනා කරන්න. එයම පිංවතුන්ට සතර අපායෙන් මිදී සුගතිගාමී වීමට හේතුවනවා ඇත.ඉන්පසුව ඉහත සඳහන් ක්‍රියාවල යෙදී සිටියා නම් අද පටන් මම මෙම වරදින් මිදෙන්නෙමි කියා සිත එකගකර ලබා ගත්තාවූ උතුම් මනුෂ්‍ය ආත්ම භාවයෙන් සහ බුද්ධ ශාසනයෙන් මමත් දුකින් මිදී වෙනත් අයටත් පිහිට වෙමි කියා ස්ථිර අධිෂ්ඨානයක් ඇති කරගන්න.කයේ ශක්තිය සිතේ ශක්තිය ඇති මෙම අවස්ථාව අපතේ නොයවා තමා දුර්වලවූ අවස්ථාවට පැමිණියාම සතුටුවී එම සතුටු සිතින්ම ජීවිතයේ අවසානය ගෙවීමටත් බුදුරජාණන් වහන්සේ විසින් පෙන්වා දී තිබෙන අනාගත භයානක අවස්ථාවන් තුනෙන්ම මිදීමටත් පිංවතුන්ලා ස්වර්ග මෝක්ෂය ළඟාකර ගැනීමට තිබෙන ඉතාම පහසු ක්‍රමයක් නිසා මා විසින් බලවත් උත්සහයක්

සහ ගුරු පියාණන්ගෙන් ලද උපදෙස් සහ පූජනීය ලග්ගල කලයාණ වංස ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ මගපෙන්වීමත් උඩ ලීවෙමි.

1. බිය

පසේනදී කොසොල් රජතුමා දුටු සිහින 16 එයට බුදුරජාණන් වහන්සේ අද ජීවමානව වැඩ සිට අද තත්වය පෙන්වා දෙන ආකාරයට මෙයට අවුරුදු 2500කට ඉහත පෙන්වා දී තිබෙන කලි යුගයෙහි අධික ලෙස පාපය බලවත් වන නිසා සත්වයින් කරන වැරදි නිසා අපාගත වීම වැළක්වීමටත්

2.බිය

එම හේතුව උඩ ආයුෂ දැඩි ලෙස පිරිහී ගොස් වර්ථමානයේ සිටින තිරිසන් සතුන්ටත් අන්ත විධියට ක්‍රියා කිරීමෙන් කාම රාගය උත්සන්න වී මව පුතා සමග ද පියා දුව සමග ද සහෝදරියන් ඔවුනොවුන් සමග ද රටේ ප්‍රභූවරයා බවට පත්වන්නේ වැඩියෙන් මිනීමරපු තැනැත්තාය. එසේ නම් ඉදිරි කාලවලදී පින මොකක්ද පව මොකක්ද කියා දන්නේ කවුද දැනගත්තත් පිංකර ගැනිමට තබා සිතීමටවත් ඉඩක් ලැබෙයිද?

3.බිය

ආයුෂ අවුරුදු 10 දක්වා බැස්සහම මෞගයන් වර්ෂාවට දින 7ක් තබා දෙවියන් විසින් සියලුම ලෝ වැසියන් ට ඇසෙන සේ අවමගුල් වෙස්ගෙන ආරක්ෂා වෙන ක්‍රමය කියා දී අතුරුදහන් වන්නේය.මෙය පෙර පිං තිබෙන සත්වයින් ඉතාමත් සුලු පිරිසක් පිළිගෙන ආරක්ෂා වන්නේය. ඉතිරි සියලු දෙනාම එක එකා ඇන කොටාගෙන අවීචි මහා නරකය ඇතලු කොට අටමහ නිරයෙහිම පිරෙන්නේය.

මෙකී සියලු සිදුවීම් වීමට තව අවුරුදු 5000 ක් වත් නැති තරම්ය.එවිට අන්තඃ කල්පයෙන් අඩක් අවසන් වන්නේය.ඉතිරි වන ඉතා සුලු දෙනා මෞගයන් වර්ෂාවෙන් පසුව එළියට අවුත් මිහී ගොඩවල් දැක බලවත් කම්පාවට පත්වී පාපයේ විපාකය බව වටහාගෙන එම සුලු පිරිස සමගිව මෛත්‍රීයෙන් පස් පවින් වෙන්වී වාසය කරන විට ක්‍රම ක්‍රමයෙන් ඔවුන්ට ලැබෙන දරුවන්ගේ ආයුෂ වැඩි වන්නේය. පරපුරෙන් පරපුරට ගුණ ධර්ම වැඩිවන්නේය. එවිට

තව තවත් ආයුෂ වර්ධනය වෙමින් අසංඛ්‍යය දක්වා වැඩි වී ගිය පසු නැවතත් කිසිම තැනක ජාති,ජරා,ව්‍යාධි,මරණ දකින්නට නැති නිසා පිං දහම්වල නොයෙදී සැප සම්පත්ම විඳ විඳ සිටින විට ක්‍රමක් ක්‍රමයෙන් අවුරුදු ලක්ෂය දක්වා ආයුෂ නැවත අඩු වන්නේය.මෙම කාලයෙහි දී මෛත්‍රී බෝසතාණන් වහන්සේ ලෝ පහල වන්නේය..

අඳුරෙහි අස්ලොබ විඳිනට දුරදී
විදුලිය පැහැ වැරදුන හොත් වරදී
විදුලියවන් මේ කය ලක් තැනදී
සිදු නොකළොත් මතු සග මොක් වරදී

(ලෝ වැඩ සගරාව)

මෙම මහා භද්‍ර කල්පයෙහි දී ලෝ පහළවන අවසාන බුදුරජාණන්වහන්සේ නැවත බුදුරජාණන් වහන්සේ නමක් පහළවන කාලය දන්නේ එම බුදුරජාණන් වහන්සේ පමණයි. මෙම කාලයෙහි දී බුදුරජාණන් වහන්සේලා හතරනමක් පහළ වෙලා ශාසන 4ක් ගෙවී යන තුරු අප තවමත් සංසාරේ ලෝ වැඩ සගරාවේ හෝ සුභාෂිතයෙහි හෝ ඇතුලත් ඉහත කවිය සඳහන් කළේ එය පෙන්වා දීමටයි.

පින්වතුනි,

අපට ඇසට පෙනෙනවා නේ ද අනිත්‍ය,දුක්ඛ, අනාත්මභාවය.එසේ නම් තව තවත් මමය,මටය, මගේය කියා මොනවාටද තණ්හාව උපදවා ගන්නේ .තමාට තමාවත් නැතිලෝකයේ තෘෂ්ණාව නැතිකර ගන්න බුදුරජාණන් වහන්සේ පෙන්වා දී තිබෙනවා.තමාගේ මව වෙනුවෙන් පියා වෙනුවෙන් දරුවන් වෙනුවෙන් වෙනත් ඥාතීන් වෙනුවෙන් වෙන්වීමේ දීත් දුකට පත්වීමෙනුත් මරණයට පත්වූ අවස්ථාවේ දීත් දුකේත් ශෝකයෙන් අඬලා එක් අයෙකු හෙලපු කඳුලු මෙම මහා සාගරයේ තිබෙන ජලයට වැඩියි කියා එසේනම් අප කවදා මෙම දුකෙන් මිදෙන්නද? මා විසින් පිංවතුන්ලාට මුලින් පෙන්වා දී ඇති මස්,මාංශ,බිත්තර ගැන අධික මිල ගනන් ගෙවා රසකර කන්නේ සංසාරයේ කවදා හෝ අපි අඬපු ,දුක්වු,කඳුලු සැලූ කෙනකුගේ බව වටහාගන්න.

පිංවතුනි,

මා විසින් පිංවතුන්ට පෙන්වා දුන්නා තුන් බියකින් අපාගත වන සත්වයින් ගැන එයට අමතරව පස්පවු දස අකුසල ආදියෙනුත් වෙනම අපාගත වන ප්‍රමාණයක් නැත.අපි තවමත් ආරක්ෂා වී සිටිමු.

මෛත්‍රී බුදුරජාණන් වහන්සේ ලෝ පහලවීමට තව අන්තප්කල්පයෙන් අඩකටත් අඩුවයි තිබෙන්නේ .

අටමහ නිරයන් වන සංජීවය,සංඝාතය,රෞරවය,කාල සූත්‍රය, තාපය,මහා රෞරවය,අවීචිය කියන නිරයන්ට අමතරව ලෝකාන්තරික නිරය ,අසුර නිකාය,ප්‍රේත ලෝකය,තිරිසන් ලෝකය,මෙම නිරයන්ට වැටුනු සත්වයින් අති දීර්ඝ වර්ෂ කෝටි,ප්‍රකෝටි,අන්තප්කල්ප මහාකල්ප ආදී වශයෙන් මහත් දුක් විදින්නේය.අහාරයක් තබා පැන් පොදක්වත් නොලබන්නේය.එසේ නම් මෙම සත්වයින් එම අකුසල ගෙවා එනවිට මෛත්‍රී බුදුරජාණන් වහන්සේත්,ශාසනයත් අතුරුදහන් වී අවසන්ය,අපාගත වූ සත්වයින්ට අමතරව අපත් ඉදිරියේදී එම ඉරණමට පත්වුවෝත් වන විපතක් එයින් අපත් මීදී උපදින දරු පරපුරත් මුදවාගෙන ඉදිරියට එන අවසාන අවස්ථාව ප්‍රයෝජනට ගැනීමට සරලම ක්‍රමයක් වූ මෙම මහා මංගල සූත්‍ර දෙශනාව මාගේ දැනීමේ ශක්තියේ හැටියට ලෝකයාට අවබෝධ කරදීම සදහා ලිවෙමි. මෙතැන්පටන් එම මංගල කරුණු 38 එකින් එක විස්තර කරමින් පිංවත් සැවොම තමාගේ සිතින්,කයින්,වචනයෙන් ,කෙරෙන සියලුම අකුසල් වෙනුවට දිවා රෑ දෙකෙහිම කුසල් වැඩෙන ආකාරයට ක්‍රියාකර,ජාති,ජරා,ව්‍යාධි මරණ,ප්‍රියයන්ගෙන් වෙන්වී මේ දුක ,තමන් පතන දේ නොලැබීමෙන් වන දුක ඇතුලු මහාදුක් කන්දරාවෙන් මිදී නිවී සැනසීමට තිබෙන මෙම අවස්ථාව ප්‍රයෝජනයට ගන්නා මෙන් නැවතත් සිහිපත් කරමි.

## මහා මංගල සූත්‍ර දේශනාව

තවද එක් සමයෙක්හි අපගේ තිලෝගුරු බුදු පියාණන් වහන්සේ අනේපිඩු සිටුතුමා විසින් පූජා කරන ලද ජේතවනාරාමයෙහි වැඩ වසන සමයෙහි එක් දිනක් මධ්‍යම රාත්‍රියෙහි එක්තරා දිව්‍යය පුත්‍රයෙක් පලාතම ආලෝකවත්

කරමින් අවුත් බුදුරජාණන් වහන්සේට වැඳ නමස්කාර කර මංගල කාරණා කියන්නේ කුමකටදැයි අසා සිටියේය.

එවිට බුදුරජාණන් වහන්සේ සියලුම ලෝක වාසී සත්වයන්ට වන යහපත දිවසින් බලා ලෝකානු කම්පාවෙන් මෙම දේශනාව කරන ලදී.

## 1. අසේවනාච බාලානං

පස්පව්,දස අකුසල්, නොකටයුතු වෙළදාම් මොහුගේ ප්‍රියතම ජීවනෝපාය වන්නේය.සමාජයට නරක ආදර්ශයක් දෙමින් සමාජයම දූෂණය කරන මොහුගෙල් වෙන්වීම මංගල කරුණකි.

## 2. පණ්ඩිතානංච සේවනා

සත්පුරුෂයා හඳුනා ගැනීම අසත්පුරුෂයා හඳුනාගැනීමටත් වඩා අසීරුය.අද සමාජය සත් පුරුෂ වේශයෙන් පෙනී සිටින අසත් පුරුෂයන්ගෙන් පිරී තිබේ.මෙය ගිහි පැවිදිවෙනසක් නැත.අජාසත් රජතුමාට එම ආත්මභාවයෙන්ම මාර්ගඵලයකට ඒමට තිබුණු අවස්ථාව අහිමි කළේ සත්පුරුෂ ලීලාවෙන් පෙනී සිට ධ්‍යාන බලයකින් නොමග යැවුවා වූ දෙව්දත් තෙර නිසාය.අදත් එතුමා පදුම නමැති නිරයෙහි බලවත් දුක් විදින්නේය. තම තමන්ලාගේ කුසල් සිත් දියුණු කර ගෙන යාමේදී යහපත් පිංවත් අය ඇසුරට ලැබෙන්නේය.තමා නිරහංකාර වූ තරමට තමාට යහපත් මිතුරන් ලැබේ.

## 3.පූජාච පූජනීයානං

තමාගේ දෙමාපියන් වැඩිහිටි ඥාතීන් ගුරුවරයින් යහමගට යාමට පාර කියාදෙන යහමග යන ආදර්ශමත් අය දුකේදී විපතේදී පිහිට වන අයට කෙළෙහිගුණ සැලකීම බුදුරජාණන් වහන්සේට ශ්‍රී සද්ධර්මරත්නයට එය ආරක්ෂා කරගෙන පරපුරෙන් පරපුරට ගෙන යන උතුමාණන් වහන්සේලා පූජනීය ස්ථානවලට කරන ගෞරවය

## 4.පතිරූප දේස වාසෝච

වරක් මඩිහෙ පඤ්ඤාසීහ මහා නාහිමියෝ යුරෝපා සංචාරයක් නිමකර ලංකාවට පා තැබූ මොහොතේම කියා සිටියෙ නිර්වාණයෙන් මෙපිට තිබෙන

උතුම්ම ප්‍රතිරූප දේශ වාසෝච කියන වාක්‍යයයි. එය තවත් සනාථ කිරීමක් වශයෙන් යුරෝපා රාජ්‍යයක් වූ එවකට දෙකට බෙදී තිබූ ජර්මනියෙ බටහිර ජර්මන් අගමැති කී සිංගර් අගමැතිතුමා ලංකාවට පැමිණ ලංකා අගමැති ඩඩ්ලි සේනානායක මහතා සමග දුම්රියෙන් නුවර බලායාමේදී අඹේපුස්ස පසු කිරීමත් සමග ප්‍රකාශ කර සිටියා මෙතරම් පොහොසත් රටක්මගේ ජීවිතයට දැක නැත කියා විදේශ ගතවී සිටින මෙරට වැසියන් දන්නවා අපේ රටේ වටිනාකම.නමුත් අපේ අවාසනාව මෙය ලෝකයේ දිළිදුම රටවල් ලැයිස්තුවට ඇතුළත් වී තිබීම මෙම රටෙහි ඉතිරිව තිබෙන ථෙරවාදී බුදු දහම අපට ප්‍රමාණවත්ය. එය ආරක්ෂාකර අප සැමගේ ජීවිත ආරක්ෂා කර ගැනීම වැනි පිණකි.

## 5.පුබ්බේචකත පුඤ්ඤදතා

පෙර කරන ලද පිං ඇති බව දුර්ලභ බුද්ධෝත්පාද කාලයක දුර්ලභ මනුෂ්‍ය ආත්ම භාවයක් ලබා ඉපදීම දුර්ලභ සාධර්ම අවබෝධ කරගැනීමට ලැබීම සිල්වතුන් ගුණ සම්පන්න උතුමන් ආශ්‍රයට ලැබීම බුදුරජාණන් වහන්සේ අවසානයට පිරිනිවන් මණ්වකයෙහි හිඳ අවසානයට දුන්නාවූ අවවාදය අනුව සතර අපා අටමග නිරය මීදීමට අපගේ යටපත් වී තිබෙන කුසල් ඉස්මතු කරගන්න අකුසල් සිත්වලට ඉඩ නොදෙන්න. එයත් මංගල කාරණාවකි.

## 6. අත්තසම්මා පණිධිච* තමා මනාකොට තබා ගැනීම

තමා මනාකොට තබාගැනීම පිංවත්නි,බුදුරජාණන් වහන්සේ අපට පෙන්වාදී තිබෙනවා සංසාර ගත සත්වයා අඳුරෙන් අඳුරටත් ආලෝකයෙන් ආලෝකයටත් ආලෝකයෙන් අඳුරටත් අඳුරෙන් ආලෝකයටත් ගමන්කරන බව මෙය අප බුද්ධියෙන් තේරුම් ගෙන අඳුරෙන් එනම් පාප මාර්ගයට නොගොසින් අපේ තිබෙන වැරදි දුර්වල තැන් හඳාගෙන සිත මනාකොට පාලනය කරගෙන තිදොරින් කිසිම පාපයකට ඉඩ නොතබා ලබාගත්තා වු මනුෂ්‍යභාවයෙන් සමාජයට ප්‍රිය මනාප කෙනෙකු වීම පිණිස අඳුරෙන් ආලෝකයටත් ආලෝකයෙන් ආලෝකයටත් ගමන් කර මෙලොව පරලොව ජීවිත (සැප සම්පත්තියෙන්) පිදෙන ජීවිත බවට පත්කර ගන්න.

## 7. බාහුසච්චංච - උගතමනා

සසර සැරිසරන්නාවූ අපට අවශ්‍ය මාර්ගෝපකරණය නොහොත් මග වියදම උගත්කමයි එය නොමැතිව අන්ධයකු මෙන් අතපය සෑමතැනින්ම හැපී හැපී තුවාල කරගනිමින් අනුන්ගේ පිහිටෙන් ජීවත් වන්නාවූ ආකාරයට ජීවත්වීම නම් නුගත්කමකි.අන්ධයාමෙන් සතර අපාදුක්වලට ගොදුරු වෙමින් අනුන්ගේ පිංපෙත් බලෙන් එම දුක්ඛයන්ගෙන් මිදී නුගත්කම නොහොත් මිථ්‍යා දෘෂ්ඨිය නිසා නැවත නැවතත් අපා දුක්වලටම පත්වී සසරින් මිදීමත් නොමැතිව සසරම ගමන් කරන්නේය.උගත්කම නොහොත් නුවණ නොහොත් යහපත් සිතිවිලි ඇතිකර ගෙන ඒ අනුව ක්‍රියා කිරීමෙන් බුධාදී උතුමන්ලාට ගරු සරු කිරීමෙන් ධර්මයෙහි පිළිපැදීමෙන් උගත්කම නොහොත් නුවණ ලැබෙන්නේය. මෙම මංගල කරුණු 38ම නුවණ වඩන මෙලොව පරලොව යහපතම සලසන නිසා මෙහි පෙන්වාදෙන උතුම් ක්‍රියාපල නිරතුරුවම යෙදීමෙන් එය ඉෂ්ඨ වෙයි.

## 8.සිප්පඤ්ච-ශිල්ප දැනීම

ශිල්ප දැනීම නම් පැවිදි අයට වෙනමත් පුරුෂ අයට වෙනමත් ස්ත්‍රීන්ට වෙනමත් කිරීමට ශිල්ප ශාස්ත්‍රය පිහිටා තිබේ.මෙය හරි හැටි නොදත් ඉගෙන ගත් ශිල්පය නිවැරදිව ක්‍රියාත්මක නොකිරීමත් නිසා බොහෝ අය දුකට පත්වන්නේය.තමා ගිහියෙක් වුවොත් පස් පවු දස අකුසල නොකටයුතු වෙළදාම් ආදියට අයත් ශිල්ප ශාස්ත්‍ර ඉගෙනීමන් වැළකීමටත්,පැවිද්දෙක් වුවොත් බුදුරජාණන් වහන්සේ පෙන්වාදී තිබෙන ධර්ම විනයට හානි නොවන තමාගේ පුද්ගලික අවශ්‍යතාවය පතා ගිහියන්ට තෘෂ්ණාව උපදින ආකාරයට ධර්මය දේශනා නොකිරීමත්ය. කාන්තාවක් වශයෙන් තම දූ දරුවන්ට ආදර්ශමත් වන අන්දමේ ගෘහ කර්මාන්තයක් කාන්තාවකට ගැලපෙන ආකාරයට කිරීමට ඉගෙනගෙන එය හෝ තම ස්වාමි පුරුෂයාගේ කරන කියන වැඩපල වලට සහාය දෙමින් එය වැඩි දියුණු කර ගැනීම පවුලේ සමගියත් අන් අයගෙන් තම තමන්ලාට එන ප්‍රශ්නවලට භාජනය නොවීමටත් ඔවුන්ටත් එය ආදර්ශයක් වීමටත් බොහෝසෙයින් ඉඩ තිබේ.

## 9.විනයෝච සුසික්ඛිතො-මනාකොට හික්මවන විනය

මෙම මංගල කරුණත් 7-8 යන මංගල කරුණුවලටම අනුව සිත,කය,වචනය,මනාකොට පාලනය කර ගැනීමට දෙන අවවාදයයි.අපට

නිරන්තරයෙන්ම අකුසල් පිරෙන දොරටු තුන වූ සිත,කය,වචනය නිරය නොහොත් අපායට තිබෙන්නේ අකුරු 3යි. නමුත් අපේ ව-ච-න-ය කියන අකුරු 4න්ම නිරයට යාමට පවු රැස්වෙන්නේය.එනම් බොරු කීම,කේලාම් කීම,පරුෂ වචන කීම,හිස්වචන කීම,මෙම කටින් පිට කරන දෙයින් නිරන්තරයෙන්ම නිරයගාමී වන්නේය.ශිඛී බුදුරජාණන් වහන්සේ ගේ ඥාතිනියක් වී ඉපිද එම ආත්මභාවයෙහිදීම මාර්ගපල ලබාගැනීමට තිබුණු අවස්ථාවක් වචන 8ක් පමණ පාවිච්චි කර බුද්ධාන්තරයක් මුළුල්ලෙහි දරුණු විපාක වින්දේය. මෙම බුද්ධාන්තරයෙහි අන්තිම ආත්මභාවයට එහි විපාකය ගෙවීමට සිදුවිය.එය අම්බපාලි ගණිකාවයි. අපට කටට එන එන දේ කියන්න ගියාම වනදේ.

එම නිසා පිංවතුනි සිත,කය,වචනය,ප්‍රවේසම් කර ගෙන එය තමාගෙත් අන් අයගෙත් දෙලොව වැඩ පිණිස හිත සුව පිණිස යහ මගට යොමුකර ආදර්ශමත් දිවි පෙවෙතක් ගෙවන්න.එයත් මංගල කාරණයකි.

## 10.සුභාසිතාච යා වාචා - යහපත් වචනය

නමවන මංගල කාරණයෙන් පෙන්වා දුන්නා මනාකොට හික්මවන විනය එයින් තමාගෙ සිත් හික්මවුවා නම් ඊට පසු පිට වන්නේ යහපත් වචනමයි.එයින් තමාගේත් අන්‍යයන්ගෙත් දෙලොවම නොපිරිහෙන උතුම් පුද්ගලයෙකු බවට පත්වන්නේය.මෙය දියුණු කිරීමේ ප්‍රතිඵලය තමයි.බුදු,පසේබුදු,මහ රහත් යන උත්තමයින් ලොවට පහළවන්නේ මෙම යහපත් වචන ඇසීමට එදා භූමියට අධිගෘහිත දේවතාවක් සාදුකාර දී කරන ලද ශබ්දය අකනිටා බඹලොව දක්වා පඩිපෙලෙන් උඩට නගින ආකාරයට ගියෙ ධම්මචක්කපවත්තන සූත්‍ර දේශනාවයි.අප විසින් යම් ප්‍රකාශනයක් කරන කල්හි එය සත්‍යයක්වීමටත් ප්‍රයෝජන කරවීමත් මෛත්‍රී සිතින් කීමට පුරුදුවෙමු.

## 11.මාතා පිතු උපට්ඨානං

බුදුරජාණන් වහන්සේ පෙන්වා දී වදාළෙ මවුපිය උපස්ථානය බුදුරජාණන් වහන්සේට කරන උපස්ථානයක පල විපාක ලැබෙන බවය.බුදුරජාණන් වහන්සේ නමක් ලොව පහළවීමට අවුරුදු දාහක් තිබිය දී දෙවියන් විසින් ලොවට පෙන්වා දී යන්නේ එම බුදුරජාණන් වහන්සේ දැකීමට බණ ඇසීමට අපටත් මවුපිය උපස්ථාය කරන්න කියා ඒතංමංගල මුත්තමං

මෙය බෞද්ධ අබෞද්ධ වෙනසක් නොමැතිව සෑම ආගමිකයෙක්ම සෑම ජාතිකයෙක්ම කෙළහි ගුණ සැලකීමක් වශයෙන් කරන ක්‍රියාවක් එය පිංවතුන්ලා වෙනත් විස්තර දන්න නිසා නොපෙනෙන පැත්තක් ගැන කෙටි විස්තරයක් දීමට මම ක්‍රියාකරමි.එනම් දෙමාපියන් වයසට පත්වන්න වන්නම පොඩි ළමයින්ගේ තත්වයට පත්වන්නේය. එය තේරුම් ගෙන දෙමාපියන්ට පසුගිය වැරදි අඩුපාඩු මතක්කර නොදීමටත් චෝදනා මුඛයෙන් තලා පෙලා කථා නොකිරීමත් නීති පැනවීමත් දෙමාපියන්ගෙන් මෙහෙකරුවන්ගෙන් මෙන් අම්මා තමන්ගේ දරුවන් බලා ගන්නා ගෙදර වැඩ කටයුතු බලාගන්නත් යොදවන්නේ නැතුව ආගමික අංශයට යොමුකර මානසික සුවය ලැබෙන සේ නිදහස ලබා දෙන්න. පියා මුරකරුවකු යෙදවීම බරපතල පාපකර්මයකි.එසේම දෙපාර්ශවයම මෝහය නොහොත් පුහුමාන්න නිසා නොදැනුවත්වම කරගන්නාවූ බරපතල අකුසල කර්මයක් නම් පුතා විසින් තම වයසේ මිතුරන් කිහිප දෙනකු සමග එකතුවී විනෝදය පිණිස විශේෂයෙන් තම පියාට නොපෙනෙන සේ එහෙත් දැනෙන ලෙස දුම්වැටි පානය කරන්නේය.තම පියා මෝහයෙන් මුලාවී පුහු තරවටු කරන්නේය.පිස්සුද තාත්තේ අම්මට පිස්සු මම එහෙම දෙයක් කළේ නෑ.පියා මෝහයෙන් මුලාවී එය දැන දැනම අනුමත කරයි.ආ එහෙමද එහෙනම් කමක් නෑ. පුතා මිතුරන් සමග තවත් විනෝදයක් ලබයි.මෙයින් දෙපාර්ශවයම බරපතල පාප කර්මයක් කරගනී.දුවෙක් නම් තම මවට හොරා අනියම් සම්බන්ධකම් පවත්වාගෙන තමන්ගේ වටිනා චරිතය කිලිටි කරගනී.පහත් තත්වයට පැමිණේ.මව එසේ දැනගත් පසු දුවට අවවාද කරයි.අවවාද කරන විට එය නවත්වා ගැනීමට බැරි තත්වයට පැමිණ මව සහ දුව අතර තද වචන හුවමාරු පවා වන්නේය.ක්‍රියාවෙන් වෙන පාපයට වඩා තම මව සමග ඇතිකරගන්නා වාද භේද වලින් එම දුව තව තවත් මෙලොවට දුකට පිරිහීමට ඇතැම්විට ජීවිත හානි කර ගැනීමට පවා යොමු වන්නේය.මෙයින් මවටද තදබල අකුසල කර්මයක් එකතුවන්නේය.එනම් කුඩාකල සිට හොඳ නරක චාරිත්‍ර වාරිත්‍ර කියා නොදීමත් අවශ්‍ය ආරක්ෂාව නොමැතිව අනවශ්‍ය ආරක්ෂාව සැපයීමත් ටියුෂන් පංති සහ වෙනත් ගමන් බිමන් පාලනය නොකිරීම ආදරයෙන් කරුණාවෙන් වැඩිහිටි දෙමාපියන්ගේ ආශිර්වාදයට එකඟව කටයුතු කිරීමේදී එයින් පසුකාලීනව තමන්ට ඇතිවන මෙම මවට පියාට ගරුකළා ඔවුන්ගේ කැමැත්ත අකමැත්ත ඇතිවයි කළේ එම නිසා මම දුක්වන්නේ නෑ කියා සිත එකග කර ගනී.

තවත් ක්‍රමයක් නම් දෙමාපිය දූ දරුවන් විදේශ දුසිරිත් අනුගමනය කරමින් මිය පරලොව යන දෙමාපියන් තම නිවෙස්වල වතුවල මලයකුත් ප්‍රේතයින් නොයෙකුත් සත්වයින් වශයෙන් සහ අපාගත වන ක්‍රියාවක් කරගනී.එනම් (බර්ත් ඩේ පාටි)උපන්දින උත්සව නමින් අපේ රටට,ජාතියට.ආගමට නොගැලපෙන ආකාරයේ නිවසේ හෝ උත්සව ශාලාවක පවත්වන උත්සවට එයින් කෙරෙන්නේ (ජීවිතං අනියතං මරණං නියතං) කියන අවසාන කාලයේ කරන භාවනාව වෙනුවට තව තව තෘෂ්ණාව උපදවන ආකාරයට ශරීරයේ අනිත්‍යභාවය මෙනහි කරනවා වෙනුවට හිස කෙස්වල පාට ගාමින් නැති තරුණභාවයක් ගැනීමත් දුවලා පුතාලා එය උලුප්පා තම සාමාජිකයිනට පෙන්වීමත්ය.මෙය ලෝවැඩ සගරාවේ තිබෙන

මස්ලේ නැති ඇට බලුලෙව කන්නේ
කුස් පිරුමක් පලයක් නොල බන්නේ
ලෙස ඒ සැපතෙහි ලොබ නොසිතන්නේ
දොස් නොපෙනෙනු මිස දුක්මයි වන්නේ

තවත් ක්‍රමයක් නම් මරණාසන්න අවස්ථාව ලංවන විට ඇතෙමෙක් විලාප දීමෙන් ද ඇතමෙක් ධර්මාශෝක රජතුමාට මේන් නොවුවමනා සාත්තු කිරීමෙන් ද මරණාසන්නයේදී ඇතිවන ආලය හො වෛරය උඩ හොඳ තැනක හොඳ උත්පත්තියක් වෙනුවට දුකඛිත උප්පත්තියක් ලබන්නේය.මෙය දෙපාර්ශවයම කරගන්නා මෝඩ වැඩකි. ඉන්පසු තොවිල්,මලයකුන් එලවීම්වලට කාලය සහ මුදල් වැය වන්නේය. පිළිකුළ,වෛරය නමැති පාප සිතිවිලිකරුණා,මෛත්‍රී සිතිවිලි වෙනුවටෙ එකතුවන්නේය. දෙපාර්ශවයම දුකෙන් දුකට පත්වන්නේය.

## 12.පුත්ත දාරස්ස සංගහෝ - අඹුදරුවන්ට සංග්‍රහ කිරීම

ගිහියෙකුට විවාහ ජීවිතයේ ලැබෙන පෙර පින සහ මෙලොව යහපත් ක්‍රියාව මත කරන විවාහය යහපත් අඹුදරුවන් ලැබීමත් පෙර අකුසලයක් මෙලොව ආත්මාර්ථකමීත්වයත් උඩ කෙරෙන විවාහය වඳක භාර්යාවන් සහ එයට සම්බන්ධ ඒ වගේම දරුවන් ලැබීමත් මෙම කාරණා දෙකත් සිහිතබාගෙන

පරලොව යහපත පිණිස යහපත් සිතුවිල්ලෙන් යහපත් ක්‍රියාවෙන් කටයුතු කළ යුතුය.ඒ අනුව පියා විසින් දරුවන්ට ආදර්ශමත් චාම් ජීවිතයක් සහ රැකියාවක් කළ යුතුයි. මැත්පන් ,දුම්වැටි,මස් මාංශ, වැනි අහිංසක සතුන්ගේ මළකුණු කෑමෙන් වෙන්වීමෙන් ඔවුන්ට කරුණාව මෛත්‍රිය ක්‍රියාවෙන් පෙන්නුම් කර දිය හැකියි. කුඩාකලම පාසලෙන් සහ දහම් පාසලෙන් දෙන අධ්‍යාපන්යට වඩා ලොකු අධ්‍යපනයක් දෙමාපියන්ට ගෙදරදී කියාදිය හැකිය.මෙහි වගකීම වැඩිපුර තිබෙන්නේ මවගේ අතේ මවට පුලුවන් ඕනෑම හොඳ ළමයෙක් පියාට විරුද්ධව ක්‍රියා කරවන්න අම්මා වැරදි මග ගියත් පියාට එසේ කළ නොහැකියි.ළමයින් කුඩාකල පටන්ම හොඳ බෞද්ධ පොත්පත් ලෝවැඩ සඟරාව,සුභාෂිතය,ජාතක කථා පොත් ඉවසීම මෙලොව පරලොව ලැබෙන පල විපාක මේවා පෙන්වා දිය යුතුයි. අද සමාජය කොතරම් ගැහැණු ළමයින් මවගේ වගකීම හරිහැටි ඉටු නොකරන නිසා අතරමන්වෙනවාද බොහෝ විට ජීවිත හානි පවා කරගන්නේය.

අනවශ්‍ය ආරක්ෂාවත් ආරක්ෂාව අවශ්‍ය තැනදී නොදීමත් ඔවුන් ගැන සෝදිසියෙන් සිටිනවාට වඩා කුඩාකලම අවශ්‍ය උපදෙස් දෙන්නේ නම් මෙසේ නොවන්නේය. දකුණු පලාතේ එක්තරා සවස අමතර උගැන්වීම් කරන (ටියුෂන්) පන්තියක් තිබුණේය. එම පංතියේ ගෑණු ළමයි 5යි සිටියි.5 දෙනාම වෙලාවට පිරිමි ළමයින් 5 දෙනෙක් සමග පැන ගියේය.කොහුවල ප්‍රදේශයේ ටියුෂන් පන්තියේ පුටුවකට කලහ කරගෙන එක ළමයෙක් තව ළමයෙකුට පිහියෙන් ඇන මැරුවේය.අමතර පංතිවලින් ළමා මනසට දේශපාලන විෂ බීජද ඇතුලත් කරන්නේය. දෙමාපියන් දරුවන් උසස් තත්වයට ගේන්න කියා තරගයට කරන මෙම ක්‍රියාවන් නිසා වන කරදර විපත්ය.බොහෝ දෙමාපියන් දරුවන්ට විවාහ කටයුතුවල දී කරන බලවත් අපරාධයක් තමයි ඔවුනොවුන්ගේ සිත්වලට නොගැලපෙන විවාහයක් කරදීම ඔවුන්ට බලපෑම් කිරීම ඇතැම් දරුවන් ස්ත්‍රීන්ගේ අගුණ දන්නා නිසා දෙමාපියන්ට අකීකරු වී හිතුවක්කාරකම් කරගෙන ජීවිතයම දුක්විමට වන අවස්ථා ද ඇත.බොහෝ පිංවත් දරුවන් මහලු දෙමාපියන්ට කීකරු වී අකමැත්තෙන් නමුත් කරගත් විවාහයක් බිරිදගේ කීම පිට හොරකුගේ වේශයෙන් ගොස් තම අන්ධ මව සහ පියාට පොලු වලින් ගසා මරා අති දීර්ඝකාලයක් නිරයේ බලවත් දුක්විද එයින් මිදී අනන්ත කාලයක් සසර වෙතත් ආත්මභාව වලදී ද දුක් විද අවසාන ආත්මයේ

රහත්වෙලා පිරිනිවන් පාන අවස්ථාවට සොරුන්ගෙන් ඇටකටු පොඩි වන තුරු පොලු පහරවල් කා මැරුණු මුගලන් මහරහතන් වහන්සේගේ කථාව දරුවන් කෙසේ වෙතත් දෙමාපියන්වත් මේවා ඉගෙන ගන්න.

තවත් එවැනිම කතාවක් ජාතක පොතේ මෙසේ සඳහන්වේ .මව අහිමි වු තවත් පුතෙක් පියාට ඇප උපස්ථාන කරමින් සිටින විට නිතරම පුතේ මගේ ඇස් පියවීමට පෙර නුඹට විවාහයක් කරගනින් කියා නිතර දෙවේලේ කරදර කරන නිසා බලවත් අකමැත්තෙන් නමුත් පියාගේ සිත සතුටු කිරීම සඳහා විවාහයක් කරගත්තේය.අපේ මහ බෝසතාණන් වහන්සේ එම පියාට දාව එම බිරිඳ කුසතුල පිළිසිඳ දසමස් ඇවෑමෙන් පුතෙකු වී උපදී.පුතා ටික ටික වැඩෙන්න වැඩෙන්න ලේලිය විසින් මාමාට නොයෙක් ආකාරයේ වෙනස්කම් කරන්න පටන් ගත්තේය.නමුත් මහලු පියාට තිබෙන ආදරය නිසා පුතා පියාට කරුණාව දැක්වීය.මෙය නොරිස්සූ ලේලිය තම ස්වාමි පුරුෂයා කොහේ හෝ ගොස් ගෙදර එන විට තැන තැන කැඩි කෙළ පාරවල් තබා නොයෙකුත් දේ කියමින් පියා කෙරහි තිබුණු සෙනෙහස තරහකට මායමින් හැරෙව්වේය.මහලු පියා කෙරහි තිබුණු සෙනේහස තරහකට මායමින් හැරෙව්වේය.කෙසේ හෝ තම කුඩා පුතා විමසිල්ලෙන් හිටියේ සොහොනේ වලක් කැපීමට අවශ්‍ය උපකරණ සගවා තබා මහලු පියා කර තබා සොහොනට ගෙනාවේය. මහලු පියා පසෙක තබා වලහාරා අවසන් වු පසු බෝසත් පුතාත් උදැල්ල අරගෙන තවත් තැනක වලක් කැපුවේය.එය දුටු පියා පුතා මොකද කරන්නේ කියා ඇසූවිට මමත් තාත්තා වගේ තාත්තත් වයසට ගියාම පණපිටින් වළලන්න වලක් හාරනවා කියා උත්තර දුන්නේය.තාත්තට කරන වරද සහ ස්ත්‍රියක් නිසාවන අකුසලය මතක් වී මහලු පියාගෙන් සමාව ගෙන කුඩා පුතත් සමග ගියේය.

## 13.භාර්යාවන්ට සංග්‍රහ කිරීම

සාර්ථක පවුල් ජීවිතයක් ගෙවීම සඳහා ස්වාමිපුරුෂයා විසින් භාර්යාවට තමාගෙන් විය යුතු යුතුකම් කොටස නොපිරිහෙලා කළ යුතුයි.සිය බිරිඳ විසින් ද එම ආකාරයටම ක්‍රියාකළ යුතු දෙදෙනාම ප්‍රිය වචන කථා කිරීම මොනම හේතුවක් නිසාවත් අවමන් නොකිරීම දෙදෙනා කෙරහි අවංකවීම සැක සිතින් වාසය නොකිරීම නෙත් පර පුරුෂයින් පර ස්ත්‍රීන් ගැන නොසිත්ම ලැබෙන්නට

සිටින දරුවන් ගැන සිතා වාසනාවන්ත දරු ඵල ලබා ගැනීමට පස්පව්,දස අකුසල් නොකටයුතුකම් වෙළදාම් ආදියෙන් විශාල වස්තු ඉපදවීමට වඩා එදිනෙදා කටයුතු ධාර්මිකව කරගෙන යාම සදහා මස්, මාංශ,බිත්තර සහ එයට අඩංගු කෑම වර්ගවලින් තොරව දස පුණ්‍ය ක්‍රියාවන් හි යෙදීමෙන් යහපතක් මිස අයහපතක් වෙන්නේ නැත.

1 බුදුරජාණන් වහන්සේ ජීවමානව වැඩ සිටින සමයේ ධනවත් සිටු යුවළක් ඔවුන්ගේ ධනයට දරු සම්පතක් ප්‍රාර්ථනය කර බුදුරජාණන් වහන්සේ ප්‍රධාන කොට සංඝරත්නයට දනක් සූදානම් කර ආරාධනා කළේය. බුදුරජාණන් වහන්සේ එය ඉවසා දනට වැඩි සේක.මාළිගාවට ඇතුලුවන තැන සිටු යුවළ අධිෂ්ඨානයක් කර පලසක් එලුවේය.එම අධිෂ්ඨානය නම් අපට දරු සම්පතක් ලැබෙන්න නම් බුදුපියාණන් වහන්සේ ඔවුන්ගේ ප්‍රාර්ථනාව ඉෂ්ට නොවන බව දැන පලසට පිටින් වැඩිසේක.දෙදෙනාම සිත් තැවුලට පත්වී බුදුරජාණන් වන්සේගෙන් හේතුව විමසූවිට පෙන්වා දුන්නේ අතීත භවයක දී මෙම දෙදෙනා මුහුදින් ගමන් කරද්දී අතර මග දී නැව කැඩී අතරමංවී ලී කොටයක ආධාරයෙන් ගොඩබිමකට බැස එහි කෑමට කිසිවක් නොමැතිව කුරුලු බිත්තර කාපු විපාකය නිසා

2 නමුත් පිංවතුනි වර්ථමානයේ කුරුලු බිත්තර නොව මිනී මස් කෑවත් දරුවන් ලැබෙන්නේය.හේතුව මෙයයි.අද විවාහ මංගල්‍යය බොහෝමයක් කෙරෙන්නේ දෙපාර්ශවයේම සිවුපසයටම ප්‍රධාන තැන දෙමින්ය.සාර්ථක විවාහයක් ගෙන යාමට දැනුම අඩුය එය පෙන්වා දීමට සිටින අයත් ආදර්ශභාවයෙන් අඩුය.ණයට,පොළියට,ඉඩම් ආදී වෙනත් දේ උගසට තබා තමාගේ පම්පෝරිය පෙන්වීමට මුදල් වියදම් කර අනවශ්‍ය උත්සව සහ උත්සව ශාලා තාවකාලික කුලියට ගෙන දුම්වැටි,මත්පැන්,මස්,මාංශ, ප්‍රධාන කොට නොගැලපෙන කෑම බීම කිසිම සංස්කෘතියකට නැති විලාසිතා පහත් විනෝදාංශ නිසා මංගල කරුණු 38න් පලමුවන මංගල කරුණ වන (අසේවනාච බාලානං)කියන මංගල කරුණ අමු අමුවේම කඩ කරන්නේය.එම ස්ථානවලට යහපත් මිත්‍රයින්ට වඩා පාප මිත්‍රයින් එකතුවන නිසාය.දෙදෙනෙකුගේ එකතුවීමක් වන අවස්ථාවේ දී ප්‍රාණඝාතාදියෙන් මිය යන සත්වයෙකුම පිළිසිඳ ගැනීමට ඉඩ තිබේ මව නිර්දෝසයි.වරද දෙපාර්ශවයේ වැඩිහිටි අයගෙයි

දරුවා බිහිකරන අවස්ථාවේ පටන්ම මවත් දරුවාත් මොන තරම් දරුණු දුකට පත්වෙන වාද මේවා ගැන සිතා බලන්න.

## 14.අනාකුලාච කම්මන්තා- නිරවුල් කර්මාන්තය

ජීවත්වීම සඳහා සෑම ගිහියෙකුටම ආදායම් මාර්ගයක් තිබිය යුතු නමුත් එම ආදායම් මාර්ගය නිවැරදි ධාර්මික මාර්ගයක් විය යුතුයි.අකුසල වර්ධනය වන රැකියාවන්ගෙන් මෙලොවත් පරලොවත් දුකක්ම මිස කිසිම යහපතක් නම් නොවන්නේය.ආදායම් සෙවීම පිණිස රැකියා නොමැතිකමටත් දැඩි දරිද්‍රතාවයෙන් මිදීමටත් කෙසේහෝ ජීවත් වීම පිණිස පස්පව් දස අකුසල් නොකටයුතු වෙළදාම් අකමැත්තෙන් නමුත් කිරීමට සිදුවන්නේය. එනම් හොරකම් කිරීම,මංකොල්ල කෑම,මස් පිණිස,සතුන් ඇති කිරීම,ගණිකා වෘත්තියේ යෙදීම,එයට අනුබල දීම සඳහා පහසුකම් සැපයීම මත්පැන් වෙළදාම නිපදවීම, ප්‍රාණඝාතය සඳහා ගැනීම විකිණීම මෙම සෑම ආදායම් මාර්ගයකින්ම එය කරන අයට වන්නේ මෙලොව වශයෙන් පොලිසි උසාවි හිර ගෙවල් ආරෝග්‍ය ශාලා සතුරු කරදර මානසික අසහනය එයින් මත්පැන් පානයට ද යොමුවන්නේය. අවසානයේ මෙලොව ඉතා දරුණු දුක් විඳ මරණයට පත්වන්නේය. මරණින් පසු අතර මග රැඳීමක් නැතුව අවුරුදු ලක්ෂ කෝටි ගණන් ඉතාමත් දරුණු දුක් ඇති අටමග නිරයෙන් හි දිවා රෑ අහරක් තබා දිය බිඳක් වත් නැතිව යමපල්ලන්ගෙන් අනෙක විධ දුක් ගැහැට විඳින්නේය.මෙහි කාල නියමයක් නැත්තේය.කවදා හෝ එම අටමග නිරයෙන් මිදී නැවත උපතක් ලබන්නේ අවුරුදු දහස් ගණන් සාපිපාසාවෙන් දුක් විඳින ප්‍රේත ආත්ම භාව වලය. කවදා හෝ එම ආත්ම භාවයෙන් මදී මනුෂ්‍ය ආත්ම භාවයක් ලබන්නේ මුලින් සඳහන් කළ ආකාරයට ඉතා දුප්පත් ,නුගත්, අතපය,විරූපව හෝ බිය උපදවන හෝ පිළිකුල් අය ය.මනුෂ්‍ය ආත්ම භාවවල සිටි කල්හි කිසිම පිනක් දහමක් දානයක් සීලයක් කර නැති නිසා අනන්ත කාලයක් අපා දුක් විඳ ලබාගත් මිනිසත් භාවයේදීත් මෙම දුක්ඛිත ජිවිත නියත මිථ්‍යාදෘෂ්ටි අභව්‍ය රටවල යුධ කල-කෝලාහල පවතින නියග අහේනිය මොවුන් දයාද කරගෙන තිබේ.

දැන් පිංවතුනි, පෙන්වා දෙන්න උත්සාහ කරන්නේ නිවැරදි වෙළෙදාම සහ ගොවිතැන ගැනයි පොත දීර්ඝවන නිසා අවශ්‍යම දේ පමණක් මින් ඉදිරියට ලියමි

ගොවිතැන් කටයුතු කිරීමේ දී සතර පොහොය ගැන බලන්න. පොළවට වගාවට වල් නාශක කෘමි නාශක භාවිතය හැකි තරම් භාවිතයෙන් වෙන්වෙන්න. කැත්ත, උදැල්ල, පාවිච්චියේදී බිම ගිනි තැබීමේ දී එහි වසල ප්‍රාණීන් ගැන බලන්න.කුඹුරේ පිදුරු ටික පිළිස්සීමෙන් වළකින්න.වෙනත් කොළ රොඩු පුවක් අතු පොල් අතු පොළොවේ දිරීමට හැරීමෙන් පොහොරත් සහ කෙසෙල් ආදී ගස්වල බිම තෙතමනයට ප්‍රයෝජනවත් වෙයි.

කරදර පාඩු,පවුපිරෙන ගොවිතැන්(පතෝල,වැටකොලු,කරවිල)වගාවන් ව්‍යාපාරික වශයෙන් කිරීම ගැන ටිකක් සිතා බලන්න. එසේම අස්වැන්න නෙළීමේදී නෙදානුවත්කම උඩ බරපතල පාප කර්මයක් අපේ ගොවි මහතුන් විසින් කරගන්නවා.එහි අනිටු විපාක මෙලොවදීම විදිනවා මා හොඳට දැක තිබෙනවා.එනම් තම තමන්ගේ නිවෙස්වල අවශ්‍යතාවයනට රසායනිකයෙන් තොරව සහ රස ගුණ කොටස වෙන්කරගෙන මුදල් ගෙවා ගන්න අය ගැන නොබලා අපිරිසිදුවට සහ වංචනිකව තමාගේ මුදල ගැන පමණක් බැලීම පලා වර්ග සෝදා පිරිසිදු නොකර එසේම වෙළදාම් කිරීමේ දී තමාගේ දියුණුවේ වේගය කොතරම් අඩුවක්වත් නොකටයුතු වෙළඳාම් ගැනත් බලන්න.අතරමැදි සහ අවස්ථානුකූලව ලාබ සොයන අයගේ ග්‍රහණයට අසුවන තමාගේ වෙළඳ භාණ්ඩයට සාධාරණ මිලක් අයකර ගැනීම අපහසු වුවත් වරදට පෙළඹෙන්න එපා.

පිංවත්නි, අද සමාජයේ බොහෝ අය පුරුදු වී තිබෙන්නේ කෙසේ හෝ වැඩි වැඩියෙන් මුදල් සැපයීමයි.ඒ සඳහා නොයෙකුත් අයථා ක්‍රම උපයෝගී කර ගනියි එසේ ධනය රැස්කරන කිසිවෙක් තාවකාලික සතුටක් ලබතත් ස්ථිර දුකක් පසුතැවීමක් පමණක් ඉතිරිකර ගනිති.අනුන්ට දෙන්නාවූ චිත්ත පීඩාදිය ශාපයක් වී ඔවුන්ගේ පසු පස් එලව එලවා මෙලොව පරලොව දුක් විපාක ම ලැබෙන්නේය. පසේනදී කොසොල් රජතුමා ගේ එක සිහිනයක් වූ තරබාරු අශ්වයෙක් දෙපැත්තෙන්ම ඔලු 2 දෙකක් ඇතිව ආහාර ගන්නේය. කොපමණ ආහාර ගත්තත් සෑහීමකට පත් නොවන්නේය. එය වර්තමානයට ගලපා බලන්න.අද බොහෝ දෙනා තමන්ට ලැබෙන පඩියට අමතරව සියලුම වරප්‍රසාද ගනිති.අන්තිමේ විශ්‍රාම වැටුපකටත් හිමිකරු වන්නේය. එසේ නමුත් අල්ලස නැතුව කිසිම වැඩක් කරවා ගැනීමට නොහැකිය.අල්ලස් ගත්තත් ඔවුන් සෑහීමකට පත්වෙනවා ද අර සිහිනයේ පල විපාක නේද?

## 15.දානඤ්ච- දානය

අප මහා බෝසතාණන් වහන්සේ එකම වෙස්සන්තර ආත්මභාවයේදී මෙම මහා පෘථිවිය සත් වරක් කම්පා කරවමින් දුන්නාවු දාන පාරමිතාව සම්පූර්ණකර ලබාගන්නාවු සම්මා සම්බුද්ධත්වයෙන් සියලුම ලෝක සත්වයින්ට දුන්නා වූ ධර්ම දානයෙන් අනන්ත සසර ජාති,ජරා,ව්‍යාධි,මරණ දුකෙන් මිදීමට නොහැකිව සතර අපායම නිවහන කරගෙන සිටින සත්ව සන්තතියට එයින් මිදීමට ප්‍රමාණවත් ය.පිරිනිවන් පා දැනට අවුරුදු 2550 ගෙවී යන තුරුත් මතු ශාසනය පවතින තුරාවට බොහෝ සත්වයින් එම ධර්ම දානය සතර අපායෙන් මිදීමට පමණක් නොව සැප ඇතිමනුෂ්‍ය ආත්මභාවයන් ලබා ගැනීමටත් ,සදිව්‍ය ලෝක සම්පත් ලබාගැනීමටත්, බ්‍රහ්මලෝක සම්පත් ලබා ගැනීමට මතුලොව පහළවන්නා වූ මෛත්‍රී බුදුරජාණන් වහන්සේගේ ශාසනයෙහි දී සියලුම සංසාර බන්ධන වලින් මිදී නිවන් සැප ලැබීමටත් එම ධර්මදානය පිහිට වාන්නේය.

## 16 ධම්මචරියාච-කුසල කර්මයෙහි හැසිරීම

සිතින්,කයින්,වචනයෙන් වන්නාවු සියලුම අකුසල කර්මයන්ගෙන් වැළකී දස කුසල ක්‍රියාවන්හි යෙදීමෙන් සිත සංවර කරගෙන අප සමාජයේ තිබෙන විෂමභාවය වටහාගෙන කම්පා නොවී ඉවසීමෙන් එය විඳ දරාගෙන ළග නොව දුරබලා කටයුතු කරගැනීමෙන් මෙලොවත් පරලොවත් ජයගත්තා වන්නේය. ඒතං මංගල මුත්තමං.

## 17.ඤාතකානංච සංගහො-ඤෑයන්ට සංග්‍රහ කිරීම

මෙම මාතෘකාවේ දී මම බොහෝ සෙයින් අසරණයි.එසේ නමුත් මට පෙන්වා දීමට තිබෙන්නේ එදා බුදුරජාණන්වහන්සේ කිඹුල්වත්පුරයට වැඩම කර ඥාති සංග්‍රහය කළ ආකාරය බුදුරජාණන්වහන්සේගේ තිබෙන අසීමිත බලතේජාවෙ බල මහිමය පෙන්වා ඥාති දමනය කර ඉන් අනතුරුව ඥාති සංග්‍රහය කළාය. නමුත් අපේ නොමග ගියාවු යන්නාවූ ඥාතින්ට අපි මොනවා පෙන්වා ඔවුන් සුමගට ගන්නද?වේදනාවෙන් භයෙන් මරණාසන්නව සිටින අවස්ථාවක අපි විසින්ම ගොස් සුලු අනුශාසනාවක් සෙත් පිරිත් ටිකක් කියා ඉන්න අයගේ සිත පාදලා එන එක පමණයි.අප ඔවුන් වෙනුවෙන් කණගටෙු වෙනවා හැර වෙන මොනවා කරන්නද? බුද්ධ පුත්‍රයින් වශයෙන් බුදුරජාණන්

වහන්සේ වෙනුවෙන් ඉතා කටුක ජීවිත ගෙවන අප බොහෝ සෙයින් නොමගට යන ඥාති පමණක් නොව සෑම කෙනෙකුටම කරුණාවෙන් ධර්මය පෙන්වා දීමට සූදානම්ය.

## 18.අනවජ්ජානි කම්මානි - නිවැරදි කර්මාන්තය

තම තමන්ගේ වැඩිහිටි දෙමාපියන් ඇතුලු තවත් හැකි අය පොහෝ දිනයන්හි දී සිල් ගැන්වීම එසේ නොහැකි නම් පූජනිය ස්ථානවලට වන්දනා මානවලට සහභාගී කරවීම බොහෝ සෙයින් ගම්බද දුප්පත් අය ගැන අවධානය යොමුකර දහම් පාසැල් පූජණීය ස්ථානවලට ඔවුන්ගේ සහභාගීවීම යොමු කිරීමට උත්සහ ගතයුතුයි. ඇති හැකි අයගේ එම උනන්දුව තිබෙනවා නම් නුගත්කමට බිලී කොක්කෙන් ඇමුණූ ඇමට රැවටෙන මත්සයින් මෙන් ඔවුන් මෙතරම් දුකෙන් මිදීමට මාර්ගය පෙන්වාදෙන ආගමක් හැර යන්නේ නැත.එය ඔවුන්ගෙත් පෙර පිං මදි නිසයි. අපේ ශ්‍රද්ධාවන්තයෝ කරන්නේ කොසොල් රජතුමාගේ සිහිනයක් වු රජ මැදුරෙ මිදුලෙ හිස් කල බොහෝමයක් තිබියදීත් පිරිච්ච මහ කළයටම වතුර පිරවීමය. එයත් ආගම පිරිහීමට හේතුවකි. නොයෙකුත් සංවිධාන, සමිති, සමාගම්, සංවිධානය වී එම අයත් නොපැහැදුනු අයගේ පැහැදීම ඇතිවන ආකාරයට ඉවසීමෙන් , මෛත්‍රියෙන්, ඔවුන්ගේ වැරදි අඩුපාඩුකම් වලට කම්පා නොවී වැඩෙන දරු පරපුර ගැන බලා ඔවුනට අවවාද අනුශාසනා කිරීමට සුදුසු නිවැරදි අය ලවා එය කළ යුතුයි. එය හැබෑ බෞද්ධයෙකුගේ නියම බෞද්ධකමයි. වෙනත් අංශයක් නම් අපේ නගරබද ජීවත්වන සෑම කෙනකුටම අත්‍යවශ්‍ය මාවත්වලට තමාගේ ගෙදර ඉදුල් වතුර නාන රෙදි සෝදන වතුර අපද්‍රව්‍ය කානු මාර්ගයෙන් පාරට එවන්නේය. බොහෝ අයට එසේ කිරීමට සිදුවී තිබෙන්නේ තම නිවස කුඩා නිසාත් එම වතුර වෙන යවන්නට මාර්ගයක් නැති නිසාත්ය. එවිට කළ යුත්තේ පාරේ තිබෙන කානුව නිවෙස් ඇත්තන් විසින් පිරිසිදු කර තමාට අයිති කොටස වතුර බැස යාමට සැලැස්වීමයි. තවත් කරුණක් නම් නිවෙස්වලට ජලනල ගැනීමේ දී පාර හරහා කානු කපා බට එලීමෙන් පසු එම ස්ථාන වලවල් හෑරී පාරේ යන එන වාහනවලටත් පාසැල් ළමුන්ටත් වෙනත් අයටත් මහත් අපහසු වන්නේය. මෙය තේරුම්ගෙන අපි නගරසභාවට පළාත් සභාවට මේවාට මෙච්චර මුදල් ගෙවා තිබෙන්නේ කියා තර්ක නොකර පාරේ ගමන්කරන අය ගැන සිතා අපේ අවශ්‍යතාවයකට කරපු දෙයකටයි සිතා එම කැඩී බිදීගිය

ස්ථාන පුලුවන් අයුරෙන් සකස් කරන්න.ඒතං මංගල මුත්තමං.

තවත් ඇතැම් අය කරන වැඩක් තමයි මහජනයාට අවශ්‍ය පාර ඉඩ තිබේ නම් එයින් තමාට අයිති කොටස පාරේ සීමාවෙන් අල්ලාගෙන මායිම් සකස් කිරීම මෙය නොකළයුතු දෙයක් ලෙස සිතා තමාගෙන් වියයුතු දෙයක් ලෙස සිතා තමාගෙන් විය යුතු සේවය කරන්න. ඉහතින් පෙන්වා දුන්නා වූ පිරිසර පිළිබඳව තවත් කියන්ට තිබෙන්නේ දුප්පත් ළමයින් යන පාසැල්වලට අවශ්‍ය උපකාර දී ඔවුන් දිරිමත්කර දී ආගම ධර්මයට යොමු කිරීමත් ආරෝග්‍යශාලා ගැන සොයාබලා කටයුතු කිරීමත් ගම්බදව සිටින අයගෙ වාද භේද සමාදාන කරවීමත් ඔවුන්ට ආදර්ශයක් වන ආකරයට මංමාවත්වල දුර්වල තැන් තාවකාලිකව හෝ සකස්කරදීමත් පුලුවන්කමක් තිබේ නම් වැසිකිලි ආදිය කරදීමත්ය.

මෙය කිරීමට යාමේදී අප මහා බෝසතාණන් වහන්සේ මඝ මානවක සිට ඉහත සදහන් කරුණු කිරීමට යාමේදී නොයෙක් කරදරවලට පැටලුනේය. ඒවාට කම්පා නොවී තමාගේ කාර්ය ගැන පමණක් බලන්න.

## 19.ආරති විරති-පාපයෙන් වැළකීම.

මෙයට අවුරුදු 30කට පෙර බුදුසරණ පත්‍රයේ තිබුණ එක් ධර්ම දේශනාවක් ආදර්ශයට ගෙන එනම් බුදුරජාණන්වහන්සේ පෙන්වා දෙනවා මෙලොව සත්වයින් අඳුරෙන් අඳුරටත් ආලෝකයෙන් අඳුරටත් අඳුරෙන් ආලෝකයටත් ආලෝකයෙන් ආලෝකයටත් කියා මගෙ ජීවිතයට එයත් ආදර්ශයක් කරගෙන මම අඳුරෙන් ආලෝකයට පැමිණියා. එයින් නොනැවතී ආලෝකයෙන් ආලෝකය වූ උතුම් බුද්ධ පුත්‍රයකු වී බුදුරජාණන් වහන්සේ වෙනුවෙන් ජීවිතය පුජාකර එම ආලෝකයෙන් ආලෝකය වූ මෙම උතුම් ධර්ම දේශනා මාර්ගයෙන් පිංවතුන්ලා අවදි කරන්නෙමි. මෙය කියවන පිංවතුන්ලාගේ ප්‍රාර්ථනාවත් එසේම විය යුතුයි. එනම්,මස්, මාංශ, බිත්තර, එයට සම්බන්ධ වෙනත් කෑම වර්ගවලින් සහ මත්පැන්, දුම්වැටි, පස්පවු, දස අකුසල් නොකටයුතු වෙළදාම් ආදියෙන් වෙන්වී පිරිත් පොතේ තිබෙන වසල සූත්‍රය. පරාභවසූත්‍රය, ආදියෙහි පෙන්වා දෙන අවවාද සිතට ගෙන ක්‍රියා කිරීමයි.

## 20. මජ්ජපානාව සඤ්ඤදමෝ - මත්පැන් පානයෙන් වෙන්වීම

පඤ්ච සීලයෙහි අවසන් පදයට මෙය එකතුකර තිබෙන්නේ වාහනයක් යන්ත්‍රයක් ක්‍රියාකරවීමට ඉන්ධන අවශ්‍ය වන්නාසේ සියලුම අකුසල පාප කර්මයන් කිරීමට පිහිටවන පළමුවන පාප මිත්‍රයා, සුරාවය, සුරා පානය කළ පසු අපාගත වීමට තිබෙන අනෙක් මාර්ගවලට අමතරව කටින් පමණක් නිරය මාර්ග 06 ක සෑදෙන්නේය.එනම්,

1. සුරාපානය
2. කටගැස්ම
3. බොරුකීම
4. කේලාම් කීම
5. පරුෂ වචන කීම
6. හිස්වචන නොහොත් කයිවාරුව සුරාපානය කළ තැනැත්තාට උමතු මානයක් ද (බොරු වෙරි) උපදී, එනම් කෙලින් සිටීමට නොහැකිකම, නන් දෙඩවීම, පුහුවීරයෙකුවීම, තමා කැපී පෙනෙන පුද්ගලයකු යැයි සිතීම අවසානයේ බලුවීම, එපමණක් ද බොහෝ අපරාධකරුවන් එම ක්‍රියාවට ප්‍රථම මත්පැන් පානය කරන්නේ එවිට ලැජ්ජාව භය මෛත්‍රිය වෙනුවට ද්වේශ පළිගැනීමේ ක්‍රියාවන් ඉෂ්ට කරගැනීමට තිරිසන් ආරුඪයක ලබා ගැනීම පිණිසයි, මෙම මනුෂ්‍ය රූපයෙන් සිටින තැනැත්තා පාප මිත්‍රයන්ට හැර අනෙක් සෑම කෙනෙකුටම වධකාරයෙක්. පාප මිත්‍රයාගෙන්ම බොහෝවිට නොසිතන කරදරවලට ද පත්වෙයි

ලෝකයේ උතුම් ශ්‍රේෂ්ඨ ජාතියක්ව සිටි සිංහල බෞද්ධයා අක්‍රිය කිරීමට යටත් විජිතවාදීන් මෙය නොයෙකුත් උපක්‍රමවලින් එයට ඇබ්බැහි කරගත්තේය.

මෙවැනි උතුම් බුදු සසුනක් තිබෙන ධර්මය ජීවමානව වැඩ සිටින එහි අනිටු විපාක ඇසට පෙනී පෙනී එය අවබෝධ කරගැනීමට නුවණක් නොහොත් පිනක් නැතිව තවත් අනන්ත අප්‍රමාණ කාලයකට කිව නොහැකි භයානක දුක් විදීමට සතර අපාගත වන මොවුන් එයින් මුදවා ගන්නේ කෙසේද? අජාසත් රජතුමාට පියාගේ උතුම් ගුණ යහපත්කම තේරුම් ගැනීමට නොහැකි වී අවසානයේ පසුතැවිලි වුනා වගේ මෙම අයටත් වෙන්නේ පසුතැවීම පමණයි. අපි අනුකම්පා කරනවා හැර වෙන මොනවා කරන්නද?

## 21. අප්පමාදොච ධම්මේසු - කුසල් කිරීමෙහි අප්‍රමාදය

අද අද එයි මරු පිංකර ගන්නේ
කුමටද සෙට මරු නේති සිතන්නේ
කොතනද මේ කය අරගෙන යන්නේ
කුමටද කුසලට කම්මැලි වන්නේ

(ලෝ වැඩ සඟරාව හෝ සුභාෂිතය)

සෑම බුදුරජාණනන් වහන්සේ නමක් විසින් අවුරුදු දහස් ගණනක් කළයුතු කාර්ය භාරයක් අප බුදුපියාණන් වහන්සේ අවුරුදු 45කින් නිම කළේය.එපමණක් ද? සෑම බුදුරජාණන් වහන්සේ නමක් ම ලොව පහළවීමට තිබෙන ආයුෂ පරතරය අන්තිමට තිබිය දී පරම්පරා පනහක් පමණ මාර බන්ධනයෙන් මුදවා නිවන් මගට ගෙන යන්නේය.

එපමණක් ද ඕනෑම බුදු බව පතන උතුමෙක් නියත විවරණය ලබා අඩුම කාලයකින් සම්මා සම්බුද්ධත්වයට පත්වූයේය.එපමණක්ද අධි සුඛෝපභෝගී ජීවිත ගෙවන පරමායුෂ අවුරුදු දහස් ගණන් තිබෙන කාලයක් නොව ඉතා කෙටි ආයුෂ ගෙවන අනිත්‍ය, දුක්ඛ, අනාත්ම, භාවය සහ ජාති ජරා, ව්‍යාධි මරණ සමග දවස් ගෙවමින් ද අධික කෙලෙස්බරව මාරයාගේ කට ඇතුළේ සිටින අවාසනාවන්ත සත්වයින් තවත් අවුරුදු දෙදහකට වැඩි කාලයක් මෛත්‍රී බුදුරජාණන්වහන්සේ වෙත යොමු කරවන්නේය. එපමණක්ද මේ තාක් සියලුම සංසාර බන්ධනවලින් මිදුන (රහත් භාවය) සත්වයින්ගේ ප්‍රමාණය ද? පඤ්ච සුද්ධා වාසවල සිටින අනාගාමී උත්තමයින්ගේ ප්‍රමාණක් තිබේද?

එපමණක් ද අවසාන මොහොතේ පිරිනිවන් මඤ්චකයෙහි සිංහ ශෛය්‍යාවෙන් නැවත නොගැටින ලෙස සැතපී තම දූ දරුවන්ට අවවාද අනුශාසනා කරන දයාබර පියෙකු මෙන් මතු අප ගැන මහත් බලාපොරොත්තු වෙන් ඕනෑකමින් දුන් අවවාදය ''අප්පමාදේන භික්ඛවෙ සම්පාදෙන'' එම බුදු පියාණන්ට කරන ගෞරවයක් වශයෙන් කෙළහි ගුණ සැලකීමක් වශයෙන් දැන නොදැන පවක් කෙරෙනවා නම් එම පවින් වළකින්න බුදුරජාණන්වහන්සේට කරන එම ගෞරවයේ සැප සම්පත් භුක්ති විදින්නේ වෙන් කවුරුත් නොව පිංවතුන්ම බව සිතන්න.

## 22.ගාරවොච නිවාතොච - ගරු කළ යුත්තන්ට ගරු කිරීම

මෙය අපට ක්‍රියාවෙන්ම පෙන්වා දුන්නේ බුදු රජාණන් වහන්සේමයි.එනම් අනන්ත සක්වලත් තමන් වහන්සේට වඩා උතුම් කෙනෙක් නොමැති වුවත් මටත් ගුරුවරයෙකු සිටිය යුතුයි. මමත් කාට හෝ ගරු කළ යුතුයි කියන සිතිවිල්ල උඩ බුදුපියාණන් වහන්සේ දෙසූ ධර්මය ගුරුවරයා ලෙස සිතා එයට ගරු කළේය. ඉපදී දින 7න් තම මෑණියන් අහිමි වූ අවස්ථාවේ තම කුසින් බිහිකළ නන්ද කුමරු කිරි මෑණියන්ට භාරදී දරු සෙනෙහසින් මහා ප්‍රජාපතී දේවිය කළ උපහාරයට නීති අටක් උඩ පැවිදි උපසම්පදාව දුන්නේය. පිරිනිවන් පෑමට අවසර ගෙන විහාර සීමාව පසුවෙන තුරු පසු ගමනින් වැඩි සේක. නන්ද කුමරුට මාර්ගඵලය ලබා දුන්නේය. මේවා ආදර්ශට ගෙන සමාජයේ කා අතරත් නොයෙකුත් ප්‍රශ්න අමනාපකම් ඇති වුණත් එය අමතක කර සිහි නුවණින් කටයුතු කරන්න.

## 23.සන්තුට්ඨිච කතඤ්ඤුතා - යටහත් පැවැත්ම හෙවත් නිවාත ගුණය

මෙය අප බුදුපියාණන් වහන්සේ මංගල කාරණයක් ලෙස පෙන්වා දී තිබෙන්නේ අපේ සිතෙන් කයෙන් වචනයෙන් සිදුවන අකුසල් නැති කිරීම සඳහායි. එනම් යටහත් පහත්භාවය ඇතිකරගත්තාම මානය නමැති පාප සිතිවිලි යටපත් වීමටයි මෙය බුදුරජාණන්වහන්සේ ක්‍රියාවෙන්ම කර පෙන්වූයේ ඥාති සංග්‍රහය පිණිස වැඩිය අවස්ථාවේ දී ගෙපිළිවෙලින් පිඩුසිගා වැඩීමෙන් පිය රජතුමා ප්‍රධාන සියලුම ශාක්‍යයින්ගේ මානය දුරු කිරීමටයි. එම අවස්ථාවට පමණක් එය සිතට ගෙන පසුව අමතක කිරීමේ විපාකය වශයෙන් එම ආත්ම භාවයෙහි දීම විඩූඩ කුමාරයා ඔහුට කරපු අවමානයට පළිගැනීමක් වශයෙන් ළදරුවාගේ පටන් මහල්ලා දක්වා සියලුම ශාක්‍ය වංශයින් මැරුවේය. අප සමාජයේ මාන්නය නිසා කොතෙකුත් අවුල් වියවුල් ප්‍රශ්ණ ඇති වෙනවාද, උස් මිටිකම්,වෛරයක්කාරයින්, අපහාස කිරීමට බලා සිටින අය පිංවතුන්ලා දන්න එවැනි දේ කොපමණ සමාජයේ තිබෙනවාද මේවා පෙනුන නිසා තමයි මෙයට අවුරුදු 2500කට එපිට අපගේ ජීවිත ආලෝකමත් කර ගැනීමටත් පරලොව බල්ලන්, වඳුරන් වී උත්පත්ති නොලැබීමටත් මහා මංගල සූත්‍ර දේශනාවට මෙය එකතු කළේ. ඒතං මංගල මුත්තමං

## 24.සන්තුට්ඨිතා - ලද දෙයින් සතුටුවීම

මෙය ද ඉහත සඳහන් මංගල කාරණයටම අදාල තවත් පැහැදිලි කිරීමකි ලද දෙයින් සතුටුවීම යටහත් පැවැත්ම නොහොත් නිවාත ගුණය. දියුණු කරගැනීමට මහෝපකාරීවන සිතිවිල්ලකි ලද දෙයින් සතුටුවීම. වේරංජන බමුණා විසින් බුදුරජාණන් වහන්සේ ප්‍රධාන සංඝරත්නයට වස් තුන් මාසයට ආරාධනා කර වස් වැස මාස තුන ගෙවන අවස්ථාව වනතුරු එය අමතක වී චාරිත්‍රයක් වශයෙන් බුදුරජාණන්වහන්සේ අවසාන දවසට පෙර දින ඔහුගේ මැඳුරට වැඩමකර මතක් කර සිටියේ පසු දින දිනය පිරිනැමුවාය. ලද දෙයින් සතුටු වීමේ මෙම ආදර්ශය අපත් සිහිතබා ගනිමු. ලැබෙන හැටියට ජීවත්වෙමු. තවත් කෙනෙකුට බරක් නොවෙමු. පසුතැවිලි නොවෙමු. දාන, ශීල, භාවනා, වැඩිදියුණු කරගනිමු. ඒතං මංගල මුත්තමං.

සඳෙමෙන් පතල පැරකුම් දුටුගැමුණු
උදේ සවස මුණිඳුට පසු සිහිකරණු
විදේශීන්ගෙ දුසිරිත් දුර හැර දමණු
මේ දේ කරන තුරු වන්නේ නැත දියුණු

මෙයට අවුරුදු 70 කටත් පෙර ආනන්ද රාජකරුණා මහතා විසින් නිබන්ධ කර තිබෙන කවියකි. මෙය එම කාලවල දී පාසැල් අධ්‍යාපනයට ඇතුලත් කර ළමයින්ට උගන්වන ලදී. අද මෙම කවියෙන් දෙන පණිවිඩය ගැන බලන්න.

හතරවන මංගල කාරණයෙන් අප රට ගැන ලෝක ප්‍රකට දෙදෙනෙකුගේ ප්‍රකාශ සටහන් කර ඇත. එය බලන්න. මුලින් සඳහන් කවියෙන් පොතක් ලිවීමට මාතෘකාවක් කරගත හැකියි ලෝකයේ ආහාර අතින් ප්‍රබල ජාතියක් වශයෙන් සහ එක්සේසත් කළ රටක් අපට හිමි කරදුන් ප්‍රධාන රජවරු දෙදෙනෙකුගේ නම් එහි සඳහන් පරගැතිභාවයට ගැතිවීමත් ආත්මාර්ථකාමී දේශපාලනයත් රටට වන අයහපත් ගැන නොබලා තම තමන් ගැනත් පුහු මාන්නයක නිසා ලෝකයේ දිළිඳු රටවල ලැයිස්තුවට එකතුවී තිබේ. කෙලහි ගුණ නොසැලකීමේ විපාකයයි. මෙය තිරිසන් සතෙකුට තුවාලයකට ප්‍රතිකර්මයක් හෝ වතුර නාවා පිරිසිදු කර කෑම ටිකක් දුන්නම එම සතා මැරෙන තුරු එම උපකාරයට උගේ ප්‍රතිචාරය පෙන්වයි. කෙළෙහිගුණ

නොදන්නා මිනිසෙකුට අවුරුදු දහයක් උපකාර කර එක දවසක් වැරදුනොත් කරපු උපකාර සියල්ලම අමතක කර දමයි. නුවණැති අයට එක දවසක් උපකාරයක් කර තිබී පසු දිනක යම් ප්‍රශ්ණයක් ඇති වුවහොත් අර කරපු උපකාරය සිහිකර කෙළෙහිගුණ සළකයි. කෙනෙකුට අසහනයක දී පිහිටක් වීමටත් නොහැක්කේ කෙළෙහි ගුණ නොදන්න නිසායි. එනම් ගොවිතැන් කර ගැනීමට ඉඩමක් නැති කෙනෙකුට තිබෙන කෙනාට දීමට නොහැක්කේ දුන්නොත් නඩු කියා අයිතිකර ගැනීමට යන නිසයි. ගෙයක්, මිලමුදලක් වෙන උපකාරයක් කිරීමට ගියත් කෙළෙහි ගුණ නොදන්නා මිනිසුන් සමාජයේ බහුල නිසයි.

## 26.කාලෙධම්ම සවණං - සුදුසුකල ධර්ම ශ්‍රවණය

අතිදීර්ඝ කාලාන්තරයක් මුලුල්ලෙහි ඇස්,ඉස්,ප්‍රමාණය කළ නොහැකි තරම් ද මස් මෙම පෘථිවියෙහි පස්වලට වැඩියෙනක් ද ලේ මහා සාගරයේ ජල ප්‍රමාණයට වැඩියෙන් ද දන්දී සම්පූර්ණ කලා වූ පාරමිතාවෙන් ගෙන් ප්‍රාර්ථනා කලේ සියළුම සංසාර සත්වයින් සසර දුකෙන් මිදවීමය. එකම ප්‍රාර්ථනාව බුදු බවම පමණක් කර දැඩි දුක් වේදනා සිත් තැවුල්වලින් කම්පා නොවී දැඩි උත්සහායෙන් සම්මා සම්බුද්ධත්වයට පත්වී ලෝක සත්වයින් දෙස බලා මම මෙතෙක් දැඩි වෙහෙසක් ගෙන අවබෝධ කරගත්තාවූ ඉතා සියුම් ධර්මය කෙළස්වලට ම යටවී සිටින සත්වයාට කෙසේ අවබෝධ කරන්න ද කියා සිතූ සිතිවිල්ල දැනගත් අඛනිට්ඨා බඹලොව බ්‍රහ්ම රාජයාණන් විසින් ස්වාමිණි ධර්මය දේශනා කරන සේකවා එසේ නොකළොත් ලෝකය නැසෙන්නේය. ධර්මය අවබෝධ කරගැනීමට හේතු වාසනා ඇති සත්වයෝ බොහෝ සෙයින් සිටිති. ඒ නිසා ලෝකානු කම්පාවෙන් ධර්මය දේශනා කරන සේක්වායි ආරාධනා කළේය. අප රටේ තවමත් මිනිසුන් වනචාරී ගෝත්‍රික තත්වයට පත් නොවී හොඳ ගති පැවතුම් ශිෂ්ට සම්පන්න ජාතියක් වශයෙනුත් සතර අපා අටමහා නිරයන්ට නොයා දෙව් මිනිස් ආත්මභාවයන් ලබාගත්තේ එම ධර්මයේ බලයෙන්ය. එම නිසා ධර්මය ශ්‍රවණය කිරීම ඉගෙන ගැනීම ඒ අනුව ජීවත් වීම අන්‍යන්ට පෙන්වාදීම හැදෙන උපදින පරපුර ගැන සිතා ක්‍රියාකිරීම ධර්මය යටපත් නොවීමට වගබලා ගැනීම අපේ වගකීමකි.

## 27.ඛන්තීච - ඉවසීම

පිංවත්නි, අප සෑම කෙනෙකුටම මාර්ගඵලයකට පත්වන තුරු එකලොස් ආකාරයක ගින්නෙන් පිච්චෙන බව අපේ බුදුරජාණන් වහන්සේ විසින් පෙන්වා

දී තිබෙනවා. සැමදාම මොකක් හෝ ප්‍රශ්ණයක් මතුවන්නේය. නොයෙකුත් ආකාරයෙන් පැමිණෙන්නාවූ දුක් කම්කටොලු ,සිත් වේදනා, පාඩු නඩු චෝදනා දෝෂාරෝපන අපකීර්ති විඳදරා ගැනීම සඳහා ඉවසීම පමණයි පිහිට වන්නේ. එම නිසා ඉවසීම ඇතිකර ගැනීම මංගල කාරණයක් හැටියට බුදුරජාණන් වහන්සේ පෙන්වා වදාළසේක.

අපි නුවණින් මෙනෙහිකර ගනිමු. සුලු දෙයකට දෙපිරිසක් අතර පොඩි ප්‍රශ්ණයක් ඇති වී එයින් සිතට එන මාන්නය නමැති අකුසලය ක්‍රියාත්මක වීමෙන් ඉවසීම යටපත්වී පොඩි ප්‍රශ්ණයක් ලොකු ප්‍රශ්ණයක් බවට පත්වී නඩු, වෛර, ඇතිකර ගැනීමෙන් දෙපාර්ශවයම දුකට පත්වන්නේය. ඇතැම් අවස්ථාවල කලකෝලාහල මරණ පවා ඇති වන්නේය. ඉන්පසු පොලිසි, උසාවි, ආරෝග්‍යශාලා, ආරක්ෂාවල් ගැන අවධානය මෙයින් සිතට සැනසිල්ලක් එනවාද ආදායම් මාර්ග අඩපණ වෙනවා, වියදම් මාර්ග වැඩිවෙනවා. සිත සැහැල්ලුවෙන් පිං දහම් කරගැනීමට බාධා පැමිණෙනවා, තමන්ට පාඩුවක් උනත් අපහාසයක් උනත් කමක් නෑ කියා ඉවසීමෙන් කටයුතු කරන්න පසුතැවිලි වීමට තිබෙන මාර්ග වැසී යනවා. ඒතං මංගල මුත්තමං.

## 28.සොවචස්සතා - සුවච කීකරු බව

සුවච කීකරු බවේ ආදර්ශය ලෝකයාට පෙන්වා දී තිබෙන්නේ අප මහ බෝසතාණන් වහන්සේ සසර සැරිසරද්දී(නලපාන ජාතකය, ලක්ඛනමිග ජාතකය) තිරිසන් ආත්ම භාවවල ඉපදී තමාගේ පිරිවර සුවච කීකරු වීම නිසා විලට අධිගෘහිත රාක්ෂයාගෙන් ද මුව දඩයක්කාරයින්ගෙන් ද ආරක්ෂා උනේය. එපමණක්ද වර්ථමාන සුනාමි විපත සිහිගන්වා සමුද්‍ර වානිජ ජාතකය බෝසත් පිරිස එදා ජල රකුසාගෙන් පමණක් නොව සදාකල්හිම දුකක් වේදනාවක් නැත්තාවූ සංසාර දුකෙන් ද මිදුණේය. එදා මහ බල සම්පන්න අධිරාජ්‍යයක් වූ ධර්මාශෝක රජතුමා කුඩා සත් හැවිරිදි සාමණේරයන් වහන්සේට කීකරුවීමෙන් ලැබූ සතුට. සැනසිල්ල .බුදුරජාණන් වහන්සේට, ධර්මයට, අසූ මහා ශ්‍රාවකයින් වහන්සේලාගෙන් පැවත එන සංඝරත්නයට කරන කෙළහි ගුණ සැලකීමක් හා කීකරුවීමක් වශයෙන් මෙයට අවුරුදු 2500කට ඉහත ආරම්භ කර මෙම බුද්ධ ශාසනය පරපුරෙන් පරපුර ඉදිරියට ගෙන යාමට දායකවන්න.

## 29.සමණානංච දස්සනං - උත්තමයන්ගේ අවවාද අනුශාසනා පිළිගැනීම

උත්තමයන්ගේ අවවාද අනුශාසනා අසපු උතුමන් අතර ප්‍රධාන වන්නේ රාහුල රහතන් වහන්සේය.සෑම දිනකම වැලි අහුරක් අතට ගෙන මෙම වැලි ගණනට අවවාද ලැබේවායි ප්‍රාර්ථනා කරයි. බුදු පියාණන් වහන්සේ ද නිතරම තම පුතුට අවවාද අනුශාසනා දෙන්නේය. වර්තමාන අවවාද අනුශාසනා ගැනීමේදී බොහෝ සෙයින් ප්‍රවේශම් විය යුතුය.එහෙත් හොඳ ආදර්ශ ජීවිත ගත කරන බුද්ධ ධර්මය අනුව පිළිපදින ජීවිත ගත කරන අයගෙන් උපදෙස් ගත යුතුයි.ඒ මන්ද ලෝක ස්වභාවය මනුෂ්‍යයාට හඳුනාගැනීමට නොහැකි අන්දමට වැසී තිබෙන නිසා අද අපට අවවාද අනුශාසනා දෙන උතුම්ම ගුරුවරයා බුදුරජාණන් වහන්සේගේත් ගුරුවරයා වූ ශ්‍රී සද්ධර්මයයි. එම වටිනා පොත් ශ්‍රද්ධාවෙන් යුතුව කියවන විට අපට නියම මාර්ගය පෙන්වා දෙන ගුරුවරයා එයම බව වැටහෙයි.

ශ්‍රමණයන් වහන්සේලා දැකීම යන වගන්තිය කියවුවත් බොහෝ බෞද්ධයෝ පවු පුරවා ගනිති. භික්ෂූන් වහන්සේලාට පාරක බැසයාමට නොව තම වාසස්ථානයේ සිටීමට පවා බැරිවූ සිද්ධීන් කොතෙක්ද බුද්ධ ශාසනයට එරෙහිව කරන කුමන්ත්‍රණ නිසා උනාද වෙනවාද මෝඩ බෞද්ධයන් සහ බෞද්ධ වේශයෙන් පෙනී සිටින මිථ්‍යා දෘෂ්ඨිකයින්ද ඔවුන්ට ඩොලර්, රන්පවුම් සපයන විදේශ බලවේග ද අද රට පුරා නිදහසේ ක්‍රියාත්මක වෙයි.ඔවුන්ගේ එම කුමන්ත්‍රණවලට බොහෝ සේ ආයුධ වන්නේ 5000ක් කල් පවත්වාගෙන යන ශාසනය ගැන නොව තමා ගැන එවෙලේ ලාභ ප්‍රයෝජන ගැන පමණක් බලන අතලොස්සක් පමණ ශ්‍රමණධාරීනුත් සිටීමයි. අද මිතුරු වේශයෙන් සිටින මිෂනාරි බලවේග වලින් ටෙලි නාට්‍ය සහ චිත්‍රපටවලින් කරන ක්‍රියාවලින් මෝඩ බෞද්ධයන් රැවටෙන්නේය. එස්.ඩබ්ලිව්.ආර්.ඩී බණ්ඩාරනායක අගමැතිතුමාට වෙඩි තැබුවේ කවුද ? එයට චෝදනා ලැබුවේ කවුද ? එම සිද්ධියේ දී නිකරුණේ නිරපරාදේ කොතරම් සිල්වත් භික්ෂූන් වහන්සේලා නින්දා අපහාසයට, අපහසු තත්වයට පත්වුවාද එම සිද්ධිය මාසයක්වත්යාමට පෙර යට ගියාය. වෙනත් වේශයකින් තවත් සිද්ධියක් මතුවන්නේය.එයට බෞද්ධන් රැවටී සිතින් වචනයෙන් පවු පුරවා ගනිමින් භික්ෂූන්ට ගරු කරනවා වෙනුවට ගරහති.(මිලින්ද ප්‍රශ්ණය) නැමති පොතෙහි නාගසේන රහතන් වහන්සේ මිළිඳු රජතුමාට පෙන්වා දෙනවා කොතරම් දුසිල් භික්ෂුවකගේ වුවත්

ශාසන ලැදි ගුණාංග 10ක් තිබෙන බව ඇවිලෙන ගිනි ගොඩක් නිවීමට උතුරන වතුරත් ප්‍රයෝජන වන උපමාව යටතේ යමක් ඇසට දුටු පමණින් කනට ඇසුන පමණින් විශ්වාස නොකර ටිකක් අත පත ගා බලන්න. ඉවසීම පුරුදු කරගන්න සිල්වත් හෝ දුසිල්වත් හෝ පැවිද්දෙකුට විඳීමට තිබෙන කටුක ජීවිතය වෙනත් කෙනකු නොදකී. පැවිද්දාගේ සිල්වත් බව හෝ දුසිල්වත් බව ගැන නොබලා තමාගේ සිල්වත් භාවය ආරක්ෂා කරගෙන සැරියුත් මුගලන් මහ රහතන් වහන්සේලා ප්‍රධාන කොට පැවත එන සඟරුවනට ගෞරව කිරීමට පුරුදුවන්න.

## 30.කාලේනධම්ම සාකච්ජා

පින්වතුනි,අප කොතෙක් බණ ඇසුවත් බණ පොත් බැලුවත් ඒ සියල්ලක් මදිය. දියෙහි ඇඳි ඉරක් මෙන් ටික දිනකින් අමතක වන්නේය. එය ලෝක ස්වභාවයකි. මෙය සිතේ ධාරණය කරගැනීමට තියුණු කරගැනීමට නුගත් දේ තව තවත් දැන ගැනීමට දැනගත් දේ තව තවත් ස්ථිරකර ගැනීමට ධර්ම සාකච්ජා කිරීම අත්‍යවශ්‍ය දෙයකි. පිහියක් මුවහත් තබන තරමට මලකඩ බැඳීම්වලින් වැළකීම ද හොඳට කැපීම ද දෙකම වන වාගේ ඉගෙන ගත් දෙය සහ ඉගෙන ගන්නා දෙය යහපත් කල්‍යාණ මිත්‍රයන් සමග සාකච්ජා කිරීම කාලේන ධම්ම සාකච්ජා ඒතං මංගල මුත්තමං.

## 31.තපොච - තපස

දස කුසල ක්‍රියාවන්හි යෙදී තමාගේ ශීලය තව තවත් දියුණු කරගෙන යන උත්තමයා පඤ්ච ඉන්ද්‍රියන්ට ගොදුරු වන්නා වූ ප්‍රිය අප්‍රිය භාවයට සිතට ඇතුලුවීමට ඉඩ නොදී සිත ආරක්ෂා කර ගනිමින් කම්මැලිකමට නින්දට වහල් නොවී ධ්‍යාන උපදවා උත්සහා කිරීමට කරන ක්‍රියාව (තපෝව) නොහොත් තපස නම්, මාර්ගඵලයට යාමට තිබෙන අවසන් ඉනිමන් පෙතයි.

## 32.බ්‍රහ්මචරියංච - බ්‍රහ්මචරියාව

කාම රාගය නොමැති එයින් වෙන්වුන ඒ ගැන සිත යොමු නොකරන උත්තමයාට (බ්‍රහ්මචාරියා) කියන නම භාවිතා කරයි. එම පුද්ගලයාට මෙලොව බොහෝ සෙයින් කරදර,අවුල්, වියවුල් නොමැත,පැවිදි ජීවිතයට බොහෝ සේ උපකාරීවේ.එම උත්තමයින්ගේ සමාජයට බොහෝසේ උපකාර වන්නේය. නොමග යන්නවුන් යහමගට ගැනීමට ඔහුට හැකියාවක් තිබේ. සත්වයින්

සසර බැඳ තබා ගැනීමටත් එයින් මිදීම වළක්වාලීමටත් ස්ත්‍රිය කෙරෙහි පුරුෂයාත් පුරුෂයා කෙරෙහි ස්ත්‍රියත් ප්‍රියමනාප වන ලෙස මැවී තිබේ. වඳුරන් දඩයම් කරන වැද්දන් විසින් ඇලෙන ඉටි ගස්වල අතුරා තබන ආකාරයට බුදුරජාණන් වහන්සේ මෙයින් සත්වයාට වන අනතුර දැක භයානක බව දැන සතර අපාගත වීමට තිබෙන ප්‍රධාන දොරටුවක් නිසා ගිහි පිංවතුන්ට පංචශීලයට (කාමෙසු මිච්චාචාරා වේරමණී) යන සිල් පදය ඇතුලත් කරන ලදී. දෙපාර්ශවයම එය පාපයට අසුවීමෙන් පරලොව වශයෙන් අති දීර්ගකාලීනව දුක්දෙන මහා නිරයන්හි යොදුන් උස කටු ඉඹුල් ගස්වලට නැග්ගවීම් ඇතුලු භයානක දුක්වලට පමුනුවන්නේය.

මෙලොව වශයෙන් නින්දා අපහාස පහත් ගති කලකෝලාහල මරා ගැනීම, නොයෙකුත් (ඒඩ්ස්) ඇතුලු සමාජ රෝගවලටද පත්වන්නේය. සමාජයට අප්‍රිය වන්නේය. එම නිසා මෙලොව අප ජීවත් වන්නේ ඉතා කෙටි කාලයකි. එම කාලය යහපත් ජීවිතයක් ගෙනයාමට මෙයත් මංගල කාරණයක් ලෙස සිතන්න.

## 33.අරිය සච්චාන දස්සනං

ආර්‍ය සත්‍ය දැකීම පළමුකොට පෘතග්ජන භාවයෙහි සිටියාහු විසින් ධර්මධර සංඝයා වහන්සේලාගෙන් හෝ චතුරාර්ය සත්‍ය ඇතුලත් පොත් කියවීමෙන් එය තේරුම් ගෙන නැවත නැවත භාවනායෝගීව මෙම දෙතිස් කුනපයේ හි ඇති නිසරු භාවයන් නිරන්තරයෙන්ම අනිත්‍ය, දුක්ඛ, අනාත්ම භාවයට අමතරව ජාති, ජරා, ව්‍යාධි, මරණ, සෝක කිරීම් හැර කිසිම සැපතක් නැත. අප සැපයක් යැයි සිතන්නේ යම් අසනීපයකට බෙහෙත් කලාම එයින් තාවකාලික සුවයක් එම අසනීපයට ලැබෙන්නේය. කිසිවෙක් නොදැනුවත්වම නව අසනිප කිහිපයක් වෙනත් වේෂයෙන් මතුවන්නේය.

දොස්තර මහතාගේ ගාස්තු, බෙහෙත්වල ගාස්තු. ගමන් වියදම්, අසනීපයට වෙනත් උවමනාවන් සඳහා, ගාස්තු ඒවාට වැයවන කාලය ඒවාත් මෙනෙහි කරන්න. ණයකට ගන්නා භාණ්ඩයක් වැන්න. මෙම ශරීරය පවත්වාගෙන යාම සඳහා අප මොනතරම් වෙහෙස වෙනවාද?

**ආශිර්විෂොපම**

මෙම සූත්‍ර දේශනාව කියවා තේරුම් ගත් දවසට තමයි අපට පෙනෙන්නේ මෙම ශරීරය පවත්වාගෙන යාම සඳහා පව් රැස්කර ගැනීමේ විපාකය එතෙක් මෙම සූත්‍ර දේශනාවේ පෙන්වා දෙන ආපෝ, තේජෝ, වායෝ, පඨවි, කියන සතර මහා භූතයන් නොහොත් විෂකුරු සර්පයින් සතර දෙනකුට මෙහෙවර කිරීමයි. එම සර්පයින්ගෙන් සතර දෙනකුට මෙහෙවර කිරීමයි එම සර්පයින්ගෙන් එකකුට හෝ අඩුවක් වුවොත් උඹ දෂ්ඨ කරයි. උපන්දා පටන් මරණය දක්වාම මෙය කළ යුතුයි. මල පසු පෙට්ටියක් ඇතුලත බහා අවසන් කටයුතු කරන්නේ මනුෂ්‍යයන් දන්දෙන්නේ පිං කරන්නේ මතු සගමොක් සැප සඳහාම විය යුතුයි. භව තෘෂ්ණාව පතා පිංකම් කරාම භවයෙහිම ඇලී ගැලී සිටින්නේය.

## 34. නිබ්බාණ සච්ඡිකිරියාච- නිර්වානය ප්‍රත්‍යක්ෂ කිරීම

අරිය සච්චාණ දස්සනං - ආර්ය සත්‍ය දැකීම

යන මංගල කාරණයටම මෙම මංගල කාරනයන් සම්බන්ධ යැයි එම මංගල කාරණයෙන්ම ඉදිරියට ආ පිංවතුන් තවත් ඉදිරියට ගෙන යාමක් මෙය සියළුම සංසාර බන්ධන වලින් මිදී උතුම් වූ රහත් භාවයට පත්වීම යනුයි. එක ආත්මභාවයකින් ඉවත්වන විටම තව ආත්ම භාවයක් ලබා දෙමින් සසරින් ගැලවීමට නොදී ආත්මයෙන් ආත්මයට ගෙන යන තෘෂ්ණාව නැති කිරීම නිර්වානාවබෝධයයි.නොහොත් දුකින් මිදීමයි, මමය, මටය, මගෙය යන හැගීම නැතිවන තුරු මෙයින් මිදීමක් නැත. එය අවබෝධ වු දවසට භව තෘෂ්ණාව නැති වන්නේය. එසේ වු විට සංසාර දුකෙන් මිදෙන්නේය. නොහොත් රහත් භාවයට පමුණුවන්නේය.

## 35.ඵුට්ඨස්ස ලෝකධම්මේහි

අෂ්ටලෝක ධර්මයෙන් කම්පා නොවීම බුදු පසේ බුදු, මහරහත්, උතුමන්ලා කිසිම දෙයකට කම්පා නොවෙයි. එය තමා රහත් බවේ ලක්ෂණය, මාර්ගඵල ලාභීහුද කම්පා නොවෙයි. ඔවුන් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම භාවය අවබෝධ කරගත් උතුමන් වහන්සේලා නිසා මෙම මංගල සූත්‍ර දේශනාවේ අඩංගු මංගල කාරණා කිහිපයක් හෝ අවබෝධ කරගෙන ඒ අනුව දිවි ගෙවන සත්පුරුෂයින්ද බොහෝ සෙයින් මෙය අෂ්ඨ ලෝක ධර්මයට අනුව වන දෙයක් බව වටහා ගෙන අනිත්‍ය, දුක්ඛ, අනාත්ම. භාවය සිහිකර නිහතමානීව ශෝකයෙන් නොතැවී සිටිති.

නින්දා, ප්‍රසංශා, ලාභ, අලාභ, දුක, සැප, යස, අයස, මෙම අටලෝ දහමට මුහුණ දීමට පුලුවන් උත්තමයින් සදා අමරණීයයි. මෙම මංගල කාරණය අවබෝධ කරගැනීමට නොහැකි අය මෙලොවත් ලතවේ. පරලොවත් ලතවේ. ඔවුන් ගේ ඥාතීන් මරනාසන්න අවස්ථාවලදී විලාප දිදී හඩයි. එවිට එම ඥාතියා පණ අදින්නේ ආලයෙන් මරණින් පසු ඔහුට හොඳ උපතක් තිබුණත් විලාප අඳෝනා නිසා මල යකුන්, පෙරේතයන්, සුනඛයින්. ගැරඩින් හෝ වෙනත් ආත්මයක් ලබා අර ස්ථානවලම උපත ලබයි. දෙපිරිසම දුකට පත්වෙයි. දැන්වත් මේවා අවබෝධ කරගෙන ලබාගත්තාවූ උතුම් මිනිසත් භාවයෙන් බුදු සසුනෙන් ප්‍රයෝජන ගන්න. බොහෝ මරණ ගෙවල්වල කුලියට අඬන ස්ත්‍රීන්ද සිටිති. ඇතැම් අයට මත්පැන් පානයට මරණය ආයුධයක් කරගනී.

### 36.චිත්තං යසසන කම්පති- ශෝක නැත්නාවූ සිත් ඇති බව

අපේ ජාතක පොතේ සදහන් ජාතක කථා වස්තුවකට මෙය උපමා කර පෙන්විය හැක. පෙර බරණැස් නුවර බ්‍රාහ්මණ පවුලක මව පියා දුව, පුතා, යෙහෙලියක්, දාසියක් වශයෙන් හය දෙනෙකු විසීය. පුතා අප මහා බෝසතාණන් වහන්සේය. මොවුන් සැමදාම සවස වන්දනාවෙන් පසුව (ජීවිතං අනියතං මරණං නියතං) යන මරනානුස්සති භාවනාව වඩන්නේය. ඔවුන්ගේ කිසිවෙක් මලපසු ශෝක නොකිරීමට ඔවුන් කතිකා කරගත්තේය. එක් දිනක් පියා සහ පුතා කුඹුරේ වැඩ කරමින් සිටින අවස්ථාවේ සර්පයකු දෂ්ටකර පුතා මිය ගියේය. පියා පුතාගේ මිනිය එසේම තිබීමට හැර වැඩට බැස්සේය. එතැනින් යන කෙනකුගේ අත ගෙදරට පණිවිඩයක් යවමින් දවල්ට එක් කෙනකුට පමණක් කෑම රැගෙන එන ලෙසත්, සවස අනෙක් අයත් වේලාසනින් එන ලෙසත් සවස සැවොම එකතුවී මිනියේ අවසන් කටයුතු ශෝක නැත්තාවූ සිත් ඇතුව කරන ලදී. අද එම ආදර්ශය අපට පෙන්වා දෙන්නේ මුස්ලිම් භක්තිකයෝයි.

### 37.අසෝකං විරජං ඛේමං- රාගාදී රජස් රහිත සිත් ඇති බව

මෙතෙක් ඉගෙනගත් මංගල කාරණාවලින් දාන, ශීල, භාවනා, දස පුණ්‍ය ක්‍රියාවන්ගෙන් දියුණු කරගත් සිතට ගලා එන සතුට නැමති ආලෝකය වසා ගන්නට එන බලවත්පාපී සතුරන් තුන්දෙනෙක් අඳුරු වේෂයෙන් එන්නේය. එනම් රාග, ද්වේශ, මෝහ නොහොත් මාන්නය මෙයින් පලමු සතුරා වන රාග

ගින්න අතිභයානකය. එය සත්වයා දුකෙන් දුකටම විපතටම හෙළන ගින්නකි. සාමාන්‍ය මිනිසා නොව අප මහා බෝසතාණන් වහන්සේ එක් ආත්ම භාවයක හිමාල වනයෙහි තපස්දම් රැක ලුනු ඇඹුල් රස උවමනා නිසා බරණැස් රජුගේ උයනට අහසින් වැඩ එම රජතුමාගේ ආරාධනයෙන් එහිම වාසය කරමින් රජ ගෙදරට දානය සඳහා දිනක් අහසින් වැඩම කරද්දී උඩුමහලේ අඩු තපිමින් සිටි රජ බිසව දැක වරදෙහි බැඳුනේය. සියලුම ධ්‍යාන බලයන් ද නැතිවිය. එවන් උතුමන්ට එසේ නම් වෙන අයට මෙම රාගය නමැති සතුරා කෙසේවේද? නමුත් මෙම සතුරාගෙන් මිදීමට එම සතුරාට සිතතුළට ඒමට ඉඩ නොදිය යුතුයි.

දෙවනි සතුරා ද්වේශය පළවෙනි සතුරාගෙන් මිදීමට අපහසු වුවත්දෙවනි සතුරාගෙන්ආරක්ෂාවීමට පුළුවන. එනම් සිතෙහි නිතරම කරුණාවෙ,මෛත්‍රිය,පලිනොගැනීමේ චේතනාව ඉවසීම යටහත් පහත් භාවය ළඟ නොව දුර බැලීම ද්වේශ කිරීමේ අනිටු විපාක මෙනෙහි කිරීම,ද්වේශය නමැති සතුරාට උදවු කරන මාන්නය නොහොත් මෝහය ඇති කර නොගැනීම මෝහය නමැති සතුරා ගැන වෙනත් මංගල කාරණයක විස්තර කර ඇත.මෝහය නොහොත් උඩගුකකම,නොහොත් මාන්නයත් සියුම් පාප සිතිවිල්ලකි.එයින් මරණින් මතු නීච කුලවල දැසි දාසයන් වඳුරු බලු ආත්මවලින් ඉපදීමට ඉවහල් වේ.මෙම තුන් ආකාරයේ පවින් මිදීමත් මංගල කාරණයකි.

## 38.එතාදිසානි කත්වාන සබ්බස්ස මපරාජිතා-චතුර්යෝග භයින් මිදුණු සිත් ඇතිබව

මහා මංගල සූත්‍ර දේශනාවේ 38 වැනි මංගල කාරණයයි.සංසාරගත සත්වයා පංචද්ව කාමයෙහි බඳවා තබාගැනීම ස්වකීය ආත්මය කෙරහි ආශාව නියත මිථ්‍යදෘෂ්ඨිය අවිද්‍යාව නොහොත් මෝහය සත්වයාට සසර දුකින් මිදීමට ඉඩ නොදී සසර බඳවා තබා ගැනීමට චතුරාර්ය සත්‍යය වසන්නා වූ කාම යෝග, භවයෝග, දෘෂ්ටියෝග, අවිද්‍යායෝගයයි. කිසිම සත්වයකුට සතර අපා දුකෙන් මිදීමට මනුෂ්‍ය දිව්‍ය බ්‍රහ්ම ලෝකවල සිටින කිසිම සත්වයකුට සතර අපා දුකෙන් මිදීමට නොහැක. පංචද්වානන්තරීය කර්මය කරගත් තැනැත්තාත් කල්ප විනාශයේ දී අවීචි මහා නරකාදියෙන් මිදුනත් මිත්‍ය දෘෂ්ඨිකයාට එයින් මිදීමක්නැත.පිටසක්වල තිබෙන නිරයක උපත ගනී. එම නිසා පිංවතුනි.සෑම පුන්‍යකර්මයක් අවසානයේදී ම ප්‍රාර්ථනා කරගත යුතු

ප්‍රධාන ප්‍රාර්ථනාව නිවන් දකිනතුරු මිත්‍ය දෘෂ්ඨි නොවේවා අභව්‍ය ස්ථානයක නොයිපදේවා බුද්ධ,ධම්ම,සංඝ කියන රත්නත්තරයම පිහිට වේවා,

ඒකාදිසානි කත්වාන
සබ්බතථ මපරාජිතා
සබ්බත්ථ සෝතථිං ගච්ඡන්තිං
තේසං මංගල මුතතමංති

සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් මෙම මහා මංගල සූත්‍ර දේශනාවේ අඩංගු කරුණු 38 එම දේවතාවට පවසා අවසාන වශයෙන් ඉහත සඳහන් දේශනාව කරන ලදී.එහිතේරුම නම් යම් සත්වයෙක් මෙකී මංගල කරුණු අවබෝධ කරගෙන පිළිපදී ද ඒ අනුව සිත සකස් කරගනී ද ඔහු සෑම තැනදීම සතුටට පත්වන්නේ යැයි කියා දේශනාව නිම කරන ලදී.

බුද්ධාදී මහෝතමයකුගෙන් හැර වෙනත් කිසිකෙනකුගෙන් දැනගත නොහැකි මෙම උතුම් අවවාදය අපගේ සිතට ඇතුල් කරගෙන එයම තමාගේ දුකෙන් මිදී හිතසුව පිණිසද අපගේ මිය පරලොව ගියාවූ යම්තාක්ඥාති මිත්‍රාදින්ටත් පිං අනුමෝදන් කරවීමටත් සමාජයේ අනෙකුත් අයටත් ආදර්ශයක් වීමටත් සිතට ගෙන ක්‍රියා කරන්න

මාගේ පලමුවන කෘතිය හැටියට මෙය තොරා ගැනීමට ප්‍රධානම හේතුව වූයේ මාගේ පැවිදි ගරු පියාණන් වූ පූජනීය පූජ්‍යපාද කහගොල්ලෙ සෝමවන්ස ස්වාමීන් වහන්සේට කරන උපහාරයක් වශයෙනුත් වර්තමාන සමාජය අද කොතරම් නොමග ගොස් සිටිනවාද එයින් ඔවුන් ටික දෙනෙකු හෝ මුදවා ගැනීමටත් මාතෘකා 38 ක් යටතේ ධර්ම දේශනා 38ක් ධර්ම දානය සඳහා පොතක් වශයෙන්ද වර්තමානයට ගැලපෙන ආකාරයෙන් ද ධර්මයට එකගවන ආකාරයට ලිවීමට මගපෙන්වූ පූජනීය පූජ්‍යපාද ලග්ගල කලයණ වංස ස්වාමින් වහන්සේගේ මග පෙන්වීමත් උඩය.

සබ්බ පාපස්ස අකරණං
කුසලස්ස උපසම්පදං
සචිත්ත පරියෝ දපණං
ඒතං බුද්ධානු සාසනං

මෙම ධර්ම ග්‍රන්ථය අකුරේගොඩ රතනසාර ස්වාමින්වහන්සේගේ පැවිදිවී පලමු උපන්දිනය වන බු:ව 2551 වු ඇසල පුන්පොහොය දිනය (ක්‍රි.ව 2007ක් වු ජූලි 29 දින)වෙනුවෙන් රාජගිරිය මැදවැලිකඩ සණස බැංකුවේ කාර්ය මංණ්ඩලය විසින් උන්වහන්සේට අනුග්‍රහ පිණිසත් ධර්ම දානයක් වශයෙනුත් මුද්‍රණය කරවන ලදී

නැවත මුද්‍රණය

මෙය යටපත්වීමට නොදී බොහෝ දෙනාගේ හිත සුවපිණිස යම්කිසි මුදලක් 50/-අය කිරීමට අදහස්කලේ තව තවත් ලැබෙන එම මුදල් වලින් මෙවන් වෙනත් ධර්ම ග්‍රන්ථ සම්පාදනය කිරීම සහ දැනට වැඩ සිටින ස්ථානයේ නඩත්තුව සහ දියුණුව සඳහාය.

මීට
පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි
දක්ෂිණ ලංකා තිස්ස විහාරය
සිදුජය පුර කිරින්ද
04-02-2012

# ගල්දූව, යෝගාශ්‍රමය

බුදුසරණ - **2000. 05. 17**




අම්බලන්ගොඩ නගරයේ සිට සැතපුම් 05 ක් පමණ ඈතින් පිහිටි ගල්දූව යෝගාශ්‍රමය ස්වභාවික වෘක්ෂලතාවන්ගෙන් වැසී ගිය අක්කර 40 ක පමණ ප්‍රදේශයකින් සමන්විත වේ.

කුරුල්ලන්ගේ මිහිරි ගී නාදයෙන් ස්වභාවිකව වැසුණු ගස්වැල් වලින් වැසී ගිය මෙම ප්‍රදේශය හරහා හමන සිසිල් සුළඟ ගත සිත සැහැල්ලුවට පත් කරයි. 1951 දී මාදම්පාගම ගුණවර්ධන රාළහාමි තමන්ට අයත් අක්කර 40 ක පමණ ඉඩම හා තම ධනය යොදවා යෝගාශ්‍රමයක් පිහිටුවීමට දරන ලද උත්සාහය ශාසනයේ උන්නතිය සඳහා ගන්නා ලද උත්සාහයකි.

කඩවැද්දුවේ ජිනවංශ හිමියන්ගේ මුලිකත්වයෙන් ආරම්භ කරන ලද මෙම ව්‍යාපාරය නිසා අද රට පුරා සෑම දිස්ත්‍රික්කයකම පිහිටුවා ඇති යෝගාශ්‍රමයන්හි භික්ෂූන් වහන්සේ 1000 ක් පමණ භාවානුයෝගිව වැඩ වාසය කරති. අම්බලන්ගොඩ කහව, ගල්දූව යෝගාශ්‍රමයේ පමණක් භික්ෂූන් වහන්සේ 50 ක් පමණ වාසය කරති. අම්බලන්ගොඩ කහව, ගල්දූව යෝගාශ්‍රමයේ පමණක් භික්ෂූන් වහන්සේ 50 ක් පමණ වාසය කරති. වයස අවුරුදු 94 ක් වන කඩවැද්දුවේ ජිනවංශ හිමියන් වාසය කරන්නේ මෙම යෝගාශ්‍රමයේය. මෙම භික්ෂූන් වහන්සේගේ පහසුව සඳහා අක්කර 40 පුරා තැනින් තැන කුටි 42 ක් තනවා ඇත. මෙම කුටිවලට ජලය ඇතුළු අවශ්‍ය පහසුකම් සපයා ඇත. භාවනා කිරීම සඳහා කුටි ආසන්නයේම ආසන තනවා ඇත.

යෝගාශ්‍රමයේ වාසය කරන භික්ෂූන් ගේ දෛනික චර්යාව සිදු කරන්නේ කතිකාවතක් අනුවය. දවසේ සියලු කටයුතු මෙම කතිකාවතට අනුව සිදු කෙරේ. වතාවත් කිරීම වන්දනාමාන කිරීම, පිණ්ඩපාත කිරීම, ත්‍රිපිටක පොත් කිරීම, භාවනා කිරීම මීට අයත් වේ. යෝගාශ්‍රමයේ සියලුම පාලන කටයුතු දායක සභාවක් (භාරකාර මණ්ඩලයක්) මගින් සිදු කෙරේ. සුමන කරුණාරත්න මහතා විසින් අක්කර 16 ක පොල් ඉඩමක් යෝගාශ්‍රමයේ නඩත්තුව සඳහා පුජාකර තිබේ. භාරකාර මණ්ඩලය මෙම පොල් ඉඩමේ ආදායමෙන් හා වෙනත් ලැබෙන පරිත්‍යාග වලින් යෝගාශ්‍රමයේ නඩත්තු කරයි. සෑම පසළොස්වකම දහසක් පමණ උපාසක උපාසිකාවෝ මෙහි පෙහෙවස් සමාදන් වෙති. විවිධ දානපතියන් විසින් මෙම උපාසක උපාසිකාවන්ට දාන මාන පැවැත්වීම විශේෂ ලක්ෂණයකි. විහාර මන්දිරයක්, චෛත්‍යයක්, පිහිටා තිබෙන අතර ධාතු මන්දිරය හා පුස්තකාලය දර්ශනීය තෙමහල් මන්දිරයක පිහිටුවා තිබේ.

දයා කළුආරච්චි


මහා මංගල
සූත්‍රය